

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ஆண்டிற்கான செயற்திறன் அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2024

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்

Land Commissioner General's Department

පටුන

පිටු අංක

1. පරිච්ඡේදය - ආයතන පැතිකඩ **5- 8**

1.1 හැඳින්වීම
1.2 දැක්ම, මෙහෙවර, අරමුණු
1.3 ප්‍රධාන කාර්යයන්
1.4 සංවිධාන සටහන
1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල

2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම **9- 12**

2.1 ප්‍රගතිය
2.2 විශේෂ වැඩසටහන්
2.3 ඉදිරි ඉලක්ක

3. පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය **13- 21**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය
3.4 ආදායම් එකතුකිරීමේ කාර්ය සාධනය
3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය
3.6 මු.රෙ. 208 ප්‍රකාරව දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන
3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය
3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

4. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක **22**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

5. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය **23**

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු
5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ **24 - 25**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය
6.2 මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය
6.3 මානව සම්පත් සංවර්ධනය

7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව **26 - 31**

1. පරිච්ඡේදය
ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත, ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත, රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යන පනත් මගින් රජයේ ඉඩම් හා සම්බන්ධ ඉඩම් කච්චේරි පැවැත්වීම, අඩු ආදායම්ලාභී පුද්ගලයන් වෙත නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබා දීම, බලපත්‍ර ලබා දීම, දීමනා පත්‍ර ලබා දීම ආදී කටයුතු මෙන්ම වැඩි ආදායම් පුද්ගලයන් සහ විවිධ ආයතන වෙත ද කෘෂිකාර්මික සහ වාණිජමය ආදී අවශ්‍යතාවයන් සඳහා දීර්ඝකාලීන බදු කර මෙන්ම නිදහස් දීමනාපත්‍ර ලබා දීම, රජයේ ඉඩම් බැහැර කිරීමේ දී කටයුතු කිරීමට අදාළ රාජකාරී යනාදී කටයුතු රාශියක් මෙම දෙපාර්තමේන්තුව යටතේ සිදු කරනු ලබයි.

1.2 දෙපාර්තමේන්තු දැක්ම

"රාජ්‍ය ඉඩම් කළමනාකරණයේ ප්‍රමුඛයා ලෙස නිරවුල් බිමක් හිමි සමාජයක් බිහිකිරීම"

1.2.1. මෙහෙවර ප්‍රකාශය

"ජාතික ප්‍රතිපත්තියක් තුල මනා සම්බන්ධීකරණයකින් යුතුව සංවර්ධනයේ චිරස්ථායී බව සහතික කරමින් රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් භාවිතා කිරීමට මහ පෙන්වමින් නිරවුල් බිමක අයිතිය තහවුරු කෙරෙන විධිමත් කළමනාකාරීත්වයක් පවත්වා ගෙන යෑම"

1.2.2. දෙපාර්තමේන්තුවේ අරමුණු හා උපාය මාර්ග


අරමුණු	උපාය මාර්ග
1 ඉඩම් නොමැති ප්‍රජාවගේ ඉඩම් භුක්තිය ශක්තිමත් කිරීම.	i ඉඩම් හිමිකම තහවුරු කිරීම. ii රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු කළමනාකරණය කිරීම.
2 ආයෝජන අවස්ථා පුළුල් කිරීම.	i ආයෝජන අවස්ථා පුළුල් කිරීම සඳහා රජයේ ඉඩම් උපයෝජනය කිරීම.
3 රජයේ ඉඩම් ප්‍රශස්ථ භාවිතය.	i රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් සංවර්ධනය කිරීම. ii රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම.
4 දෙපාර්තමේන්තුව සතු සම්පත් ප්‍රශස්ථව කළමනාකරණය කිරීම .	i මානව සම්පත සංවර්ධනය කිරීම. ii භෞතික සම්පත ඵලදායී ලෙස භාවිතා කිරීම. iii මූල්‍ය සම්පත විධිමත්ව කළමනාකරණය කිරීම.
5 රාජ්‍ය ආදායම වර්ධනය කිරීමට දායකවීම	i ඉඩම් ආදායම් හඳුනාගැනීම හා ඇස්තමේන්තු කිරීම ii ඉඩම් ආදායම් කාර්යක්ෂමව හා විධිමත්ව රැස්කිරීම. iii හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල පියවර ගැනීම.

1.3 රජයේ ඉඩම් පරිපාලනය තුල ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

ඉඩම් කළමනාකරණයේ ප්‍රමුඛයා ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව රජයේ ඉඩම් බැහැර කිරීමේදී පහත සඳහන් සුවිශේෂී වූ කාර්ය භාරයන් ඉටුකරනු ලබයි.

1. අන්තර් පළාත් වාරිමාර්ග හා ඉඩම් සංවර්ධන ව්‍යාපෘති කළමනාකරණය කිරීම.
2. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් බෙදාදීම හා බෙදා දුන් ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීම.
3. රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් බෙදාදීම, මේ යටතේ
    - නිවාස, කෘෂිකාර්මික, කර්මාන්ත හා වාණිජ කටයුතු සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාදීම.
    - විශේෂ හා නිදහස් දීමනා පත්‍ර නිකුත් කිරීම.
    - විහාරස්ථාන සඳහා පූජා භූමි ඔප්පු නිකුත් කිරීම.
    - සුනාමි දීමනාපත්‍ර සකස් කිරීම.
    - රජයේ දෙපාර්තමේන්තු, ත්‍රිවිධ හමුදාව හා පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය ඉඩම් නිදහස් කිරීම, බදු දීම හා පැවරීම.
    - නාගරික සංවර්ධන අධිකාරිය / නිවාස සංවර්ධන අධිකාරිය සඳහා පැවරුම් සකස් කිරීම.
4. ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉඩම් බෙදාදීම හා නියාදන සාධන පත්‍ර ලබා දීම.
5. රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ රජයේ ඉඩම් හා රක්ෂිත ආරක්ෂා කිරීම.
6. අන්තර් පළාත් ඉඩම් සංවර්ධන ව්‍යාපෘති වලින් බැහැර රජයේ ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දීම.
7. රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණය කිරීම.
8. රාජ්‍ය බදු ආදායම් ශක්තිමත් කිරීමට රජයේ ඉඩම් මත බදු අයකර ගැනීම කළමනාකරණය කිරීම.
9. ඉඩම් ආරවුල් නිරාකරණය කිරීම.
10. මානව සම්පත් සංවර්ධන කටයුතු පවත්වා ගෙනයාම.

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව - සංවිධාන සටහන



සුවිය

- **නි.ඉ.කො. - නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්**
- **ස.ඉ.කො. - සහකාර ඉඩම් කොමසාරිස්**
- **පරි.නි. - පරිපාලන නිලධාරී**
- **ජෙය්.වැ.අධි. - ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරී**
- **භාෂා පරි. - භාෂා පරිවර්තක**

1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රාදේශීය කාර්යාල

මෙම දෙපාර්තමේන්තුවේ ඉඩම් සම්බන්ධ රාජකාරී කටයුතු ප්‍රධාන කාර්යාලයට අමතරව අන්තර් පළාත් වාරිමාර්ග ක්‍රම යටතේ පිහිටුවා තිබෙන්නා වූ ඉඩම් කොමසාරිස් කාර්යාල 06 ක් සහ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල 02 ක් යටතේද සිදු කරනු ලබයි.

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන පිළිබඳ තොරතුරු පහතින් දැක්වේ.

1. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - අනුරාධපුරය
2. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - පොළොන්නරුව
3. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - අම්පාර
4. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - ත්‍රිකුණාමලය
5. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - දෙබරවැව
6. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - මහියංගණය
7. සහකාර ඉඩම් කොමසාරිස් - සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය - කන්තලේ
8. සහකාර ඉඩම් කොමසාරිස් - සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය - මොණරාගල

1.5.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඉඩම් I,ඉඩම් II,ඉඩම් III ලෙස පැවති ඉඩම් අංශයන් 2023 වර්ෂයේ අගෝස්තු මස ප්‍රතිව්‍යුහගත කරන ලදී.ඒ අනුව බදු අංශය, පර්යේෂණ හා සංවර්ධන අංශය,ප්‍රතිපත්ති හා විමර්ශන අංශය , පාලන අංශය, ගිණුම් අංශය හා අභ්‍යන්තර විගණන අංශය වශයෙන් අංශ 06 ක් ප්‍රධාන කාර්යාලය තුළ ක්‍රියාත්මක වේ. මෙයින් ඉඩම් අංශ තුනෙහි හා පාලන අංශයේ ප්‍රධානීන් ලෙස ඉඩම් කොමසාරිස්වරු කටයුතු කරනු ලබන අතර ගිණුම් අංශයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන ගණකාධිකාරි ද, අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණක ද කටයුතු කරනු ලැබේ.

2. පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය

අංකය	ක්‍රියාකාරකම්		ඉලක්කය	සමස්ථ ප්‍රගතිය	සමස්ථ ප්‍රගතිය(%)
1	**ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ**				
i	බලපත්‍ර සකස් කිරීම (අන්තර් පළාත්)	ගොවි පන්තිය	6000	1877	31.28
		ගැණුම් මිල	600	431	71.83
	බලපත්‍ර සකස් කිරීම (පළාත් සභා)	ගොවි පන්තිය	28000	16238	57.99
		ගැණුම් මිල	3600	1266	35.17
ii	ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර සකස් කිරීම		2000	15	0.75
iii	දීමනා පත්‍ර පසු කටයුතු (පසු උරුමය නම් කිරීම, මුල් අයිතිය සහතික කිරීම, දීමනාපත්‍ර බැහැර කිරීම, උකස් කිරීම, කොන්දේසි ලිහිල් කිරීම)		3000	1878	62.60
iv	මධ්‍යම පාන්තික දීමනාපත්‍ර සකස් කිරීම		100	54	54.00
2	**රජයේ ඉඩම් ආඥා පනත යටතේ**				
i	බදු පදනම මත ඉඩම් ලබා දීම	බදු නිර්දේශ සකස් කිරීම	2300	2837	123.35
		බදුකර සකස් කිරීම	500	517	103.40
ii	නිදහස් දීමනාපත්‍ර සකස් කිරීම		800	937	117.13
iii	රජයේ ආයතන සඳහා ඉඩම් නිදහස් කිරීම	පැවරුම් නියෝග	450	70	15.55
		දෙපාර්තමේන්තු සඳහා ඉඩම් නිදහස් කිරීම	750	650	86.66
iv	පරම අයිතිය සහිත ප්‍රදාන පත්‍ර		40000	22138	55.35
v	නාගරික සංවර්ධන අධිකාරිය / ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සඳහා ඉඩම් පැවරීම (දීමනා පත්‍ර)		20	29	145.00
vi	පූජා භූමි දීමනා පත්‍ර සකස් කිරීම (බෞද්ධ විහාරස්ථාන)		50	32	64.00
vi	සුනාමි දිමනාපත්‍ර සකස් කිරීම		100	145	145.00
3	**ඉඩම් ප්‍රදාන විශේෂ විධි විධාන පනත යටතේ**				
i	නියාදන සාදන පත්‍ර සකස් කිරීම		50	17	34
4	**ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම**		200	13	6.50
5	**කච්චේරි පැවැත්වීම**		375	36	9.60
6	**ගැටළුවලට උපදෙස් ලබාදීම හා ගැටළු නිරාකරණය**		15000	7674	51.16
7	**පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම**		50	40	80.00
8	**රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට දත්ත ඇතුළත් කිරීම**		70000	118693	169.56

2.2 විශේෂ වැඩසටහන්

2.2.1 බිම්සවිය වැඩසටහන

බිම්සවිය වැඩසටහන ඉඩම් අමාත්‍යාංශය හා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූලික දායකත්වයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 65 ක් තුළ ක්‍රියාවට නංවන ලද ඉඩම් සඳහා හිමිකම් සහතික ලබා දීමේ ජාතික වැඩසටහනක් ලෙස හඳුන්වා දිය හැක.

මේ අනුව රජයේ ඉඩම් සඳහා මෙම වැඩසටහන යටතේ 2024 වර්ෂය අවසානය දක්වා කැඩැස්තර සිතියම් යටතේ දීමනාපත්‍ර 5801 ක් නිකුත් කිරීමට හැකියාව ලැබී ඇත.. ඊට අමතරව ඉඩම් ගැටළු 512 ක් සඳහා උපදෙස් ලබා දී ඇත.

2.2.2 රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

රජයේ ඉඩම් කළමනාකරණ කටයුතු කාර්යක්ෂම කරලීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (State Land Information Management System) නිර්මාණය කිරීමට කටයුතු කර ඇත. රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙම පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු සිදු කරන අතර, ඉඩම් බෙදා දීම්වලට අදාළ ලියකියවිලි නිකුත් කිරීම හා ආදායම් රැස්කිරීමේ ක්‍රියාවලියද බෙදා දුන් ඉඩම් වලට අදාළ පසු කටයුතු හා අධීක්ෂණ කටයුතු ද මෙම පද්ධතිය මඟින් සිදු කිරීමට හැකියාව ඇත. 2013 වර්ෂයේ දී බස්නාහිර පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 40 කින් ආරම්භ වූ මෙම වැඩ සටහන 2024 වර්ෂය අවසන් වන විට දිවයින පුරා මහවැලි අධිකාරියට අයිති ඉඩම් සහ රජය සතු ඉඩම් නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හැර අනෙකුත් සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධ වෙමින් මෙම පද්ධතිය හරහා ඉඩම් රාජකාරි කටයුතු සිදු කරනු ලැබේ.

වර්ෂය	2022	2023	2024
ඉඩම් ලේඛන ඇසුරින් තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම් (ලේඛන සංඛ්‍යාව)	24,499	20,492	15,955
අනුරේඛණ සහිතව ඉඩම්වල ක්ෂේත්‍ර තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම් (ඉඩම් කැබලි සංඛ්‍යාව)	14,766	19,178	70,102
1.ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නව දීමනා පත්‍ර ලබාදීම 2.රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිදහස් දීමනාපත්‍ර ලබා දීම	8,359 0	6,367 0	0 22,432
බලපත්‍ර සංඛ්‍යාව	517	722	917
දීර්ඝ කාලීන බදුකර සකස් කිරීම	79	435	152

2024 වර්ෂය තුල රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට ඉඩම් ලේඛන 70,000 ක් ඇතුලත් කිරීමට ඉලක්ක සකස් කර තිබුණු අතර 2024 වර්ෂය තුළ අනුරේඛා සහිතව ඉඩම් කැබලි 86,057 ක ප්‍රමාණයක් පද්ධතිය හරහා ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇත.මීට අමතරව මෙම වර්ෂයේ බලපත්‍ර 917 ක් ද උරුමය වැඩසටහන යටතේ රජයේ ඉඩම් ආඥා පනත හරහා නිදහස් දීමනාපත්‍ර 22,432 ක ප්‍රමාණයක්ද අනුපිටපත් වශයෙන් e-Slims පද්ධතිය හරහා මුද්‍රණය කර ඇති අතර දීර්ඝ කාලීන බදු නිර්දේශ සහ බදු කර සකස් කිරීමට අදාළ අයදුම්පත් 152 ක් පද්ධතිය හරහා යොමු කර ඇත.එසේම මෙම වර්ෂය තුළ රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම වැඩසටහන යටතේ පුහුණු වැඩසටහන් 09 ක් පවත්වන ලදී.

2.3 ඉදිරි ඉලක්ක

2.3.1. 2025 වර්ෂයේදී ඉටු කිරීමට අපේක්ෂිත අනෙකුත් කාර්යන්ගේ ඉලක්ක පහතින් දක්වා ඇත.

අංකය	ක්‍රියාකාරකම්		ඉලක්කය
1	**ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ**		
i	බලපත්‍ර සකස් කිරීම (අන්තර් පළාත්)	ගොවි පන්තිය	5500
		ගැණුම් මිල	1150
	බලපත්‍ර සකස් කිරීම (පළාත් සභා)	ගොවි පන්තිය	24450
		ගැණුම් මිල	3500
ii	දීමනා පත්‍ර පසු කටයුතු (පසු උරුමය නම් කිරීම, මුල් අයිතිය සහතික කිරීම, දීමනාපත්‍ර බැහැර කිරීම, උකස් කිරීම, කොන්දේසි ලිහිල් කිරීම)		2000
iii	මධ්‍යම පාන්තික දීමනාපත්‍ර සකස් කිරීම		100
2	**රජයේ ඉඩම් ආඥා පනත යටතේ**		
i	බදු පදනම මත ඉඩම් ලබා දීම	බදු නිර්දේශ සකස් කිරීම	4000
		බදුකර සකස් කිරීම	600
ii	නිදහස් දීමනාපත්‍ර සකස් කිරීම		1000
iii	රජයේ ආයතන සඳහා ඉඩම් නිදහස් කිරීම	පැවරුම් නියෝග	150
		දෙපාර්තමේන්තු සඳහා ඉඩම් නිදහස් කිරීම	750
iv	පරම අයිතිය සහිත ප්‍රදාන පත්‍ර		40000
v	නාගරික සංවර්ධන අධිකාරිය / ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සඳහා ඉඩම් පැවරීම		50
vi	පූජා භූමි දීමනා පත්‍ර සකස් කිරීම		50
vii	සුනාමි දීමනාපත්‍ර සකස් කිරීම		100
3	**ඉඩම් ප්‍රදාන විශේෂ විධි විධාන පනත යටතේ**		
i	නියාදන සාදන පත්‍ර සකස් කිරීම		75
4	**ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම**		20
5	**කච්චේරි පැවැත්වීම**		150
6	**ගැටළු වලට උපදෙස් ලබාදීම හා ගැටළු නිරාකරණය කිරීම**		15000
7	**රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට දත්ත ඇතුලත් කිරීම**	පළාත්	65000
		අන්තර් පළාත්	5000

චන්දන රණවීර ආරච්චි
ඉඩම් කොමසාරිස් ජනරාල්
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
මිහිකත මැදුර
ඉඩම් මහ ඇල්කම් කාර්යාලය
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ආයතන ප්‍රධානී
නම : චන්දන රණවීර ආරච්චි
තනතුර : ඉඩම් කොමසාරිස් ජනරාල්
දිනය : 2025.02.

3. පරිච්ඡේදය

වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2024		සටහන	තත්‍ය 2024	තත්‍ය 2023	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	**1**			ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**			
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**			
102,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	148,383,339	150,083.569	
102,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		148,383,339	150,083.569	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		427,724,000	292,282,000	ඒසීඒ-3
-	තැන්පතු		13,294,493	2,478,293	ඒසීඒ-4
25,000,000	අත්තිකාරම් ගිණුම්		24,605,452	28,987,712	ඒසීඒ-5/5(ඒ)/5(බී)
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්			-	
25,000,000	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**465,623,945**	**323,748,005**	
127,000,000	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**614,007,284**	**473,831,574**	
-	**භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)**		162,705,229	41,234,321	
127,000,000	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)**		**451,302,055**	**432,597,253**	

	අඩුකළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
518,440,060	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	461,701,594	409,425,179	
159,500,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	119,744,480	106,949,408	
2,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	1,511,779	1,687,943	**ඒසිඒ-2(ii)**
-	පොළී ගෙවීම්	**8**	-	-	
1,019,940	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	530,350	779,276	
680,960,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**583,488,203**	**518,841,806**	
	මූලධන වියදම්				
26,231,920	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	21,487,111	19,599,023	
42,768,080	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	10,738,307	23,366,348	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
1,000,000	හැකියා වර්ධනය	**14**	987,400	237,665	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
70,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**33,212,818**	**43,203,036**	
	තැන්පතු ගෙවීම්		53,924,816	4,701,310	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		30,275,530	27,739,319	**ඒසිඒ-5**
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
-	**ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)**		**84,200,346**	**32,440,629**	
750,960,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		**700,901,367**	**594,485,471**	
(623,960,000)	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(249,599,312)**	**(161,888,218)**	

අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය	**(249,599,312)**	**(161,888,218)**	**ඒසිඒ-7**
දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය	-	-	**ඒසිඒ-3**
	-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2024	**2023**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	2,354,662,055	2,013,037,941
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	62,414,567	56,744,489
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		
මුළු වත්කම්		**2,417,076,622**	**2,069,782,430**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		52,107,505	5,807,103
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,354,662,055	2,013,037,941
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	10,307,062	50,937,386
අග්‍රිම ශේෂය	ඒසීඒ-3		
මුළු වගකීම්		**2,417,076,622**	**2,069,782,430**

පිටු අංක 01 සිට 31 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 32 සිට 40 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත . ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.



3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය	
	2024	**2023**
	රු.	**රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	149,239,817	76,498,191
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	74,299,519	12,984,666
අග්‍රිම ලැබීම්	427,724,000	292,282,000
අත්තිකාරම් අයකර ගැනීම්	16,305,195	19,241,681
තැන්පතු ලැබීම්	13,294,493	2,478,293
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**680,863,024**	**403,484,831**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	338,121,853	293,077,300
සහනාධාර සහ මාරුකිරීම්	939,660	1,107,001

වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	78,894,487	6,720,836
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	162,705,229	41,234,321
අත්තිකාරම් ගෙවීම්	20,572,047	17,952,130
තැන්පතු ගෙවීම්	53,928,816	4,701,310
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (අ)	**655,158,092**	**364,792,898**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**25,704,932**	**38,691,933**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	25,704,932	38,691,933
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**25,704,932**	**38,691,933**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(25,704,932)**	**(38,691,933)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය රු. ,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව 2024	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003.01.03	ඉඩම් හා අනෙකුත් බදු කුලී	102,000,.00	102,000,.00	148,383,.00	145

3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	634,200.00	680,960.00	583,488.20	85.68
ප්‍රාග්ධන	70,000.00	70,000.00	33,212.81	47.44

3.6 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ දිස්ත්‍රික් ලේකම්	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන	තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ප්‍රතිශතය
1	ඉඩම් අමාත්‍යාංශය	ගිනි නිවීමේ සේවාව	63,375.83	63,375.83	100%
		විදුලි සෝපානය	211,180.66	211,180.66	100%
		විදුලි ජනන යන්ත්‍රයට ඉන්ධන	47,550.00	47,550.00	100%
		PABX අභ්‍යන්තර දුරකතන පද්ධතිය	173,066.00	173,066.00	100%
		බිම් සවිය	12,500,000.00	917,602.40	7.34%
		මධ්‍යම වායු සමීකරණ පද්ධතිය සේවා කිරීම	645,083.76	645,083.76	100%

		ජෙනරේටරය වාර සේවා කිරීම	188,800.00	188,800.00	100%
2	ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව	මධ්‍යම වායු සමීකරණ පද්ධතිය සේවා කිරීම	645,083.76	645,083.76	100%
		අභ්‍යන්තර දුරකතන පද්ධතිය	173,066.00	173,066.00	100%
		විදුලි සෝපානය	211,180.66	211,180.66	100%
		ගිනි නිවීමේ සේවාව	63,375.83	63,375.83	100%
		ජෙනරේටරයේ වාර සේවාව	188,800.00	188,800.00	100%
		විදුලි ජනන යන්ත්‍රයට ඉන්ධන	47,550.00	47,550.00	100%
		බිම්සවිය ආරක්ෂක සේවා	633,203.34	548,228	86.58
3	විශ්‍රාම වැටුප් ණය ශේෂ නිරවුල් කිරීම	නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ/ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන්			
4	මැතිවරණ කොමිෂන් සභාව		87,500.00	87,500.00	100%

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2023**දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2024**දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	959,554,053.09	1,062,978,345.90		
9152	යන්ත්‍රෝපකරණ	265,462,376.53	300,242,354.90		
9153	ඉඩම්	761,910,964,.51	946,228,807.62		
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		
9160	කෙරීගෙන යන වැඩ	26,110,547,.18	26,110,547.18		
9180	බදු දෙන ලද වත්කම්	-	-		

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී (විගණකාධිපතිවරයාගේ වාර්තාව ඇමුණුම I මගින් දක්වා ඇත.)ඇතුලත් කරයි.

4. පරිච්ඡේදය
ආයතනයේ කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	**75%-89%**	**50%-74%**
ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර 38200 ක් සකස් කිරීම.			51%
ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර 2000 ක් සකස් කිරීම			0.75
රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් බදු නිර්දේශ 2300 ලබාදීම	123.35		
රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදුකර 500 නිකුත් කිරීම	103.40		
නිදහස් දීමනා පත්‍ර 800 ක් ලබාදීම	117.13		
දෙපාර්තමේන්තු වලට ඉඩම් 1200 ක් නිදහස් කිරීම			60%
නාගරික සංවර්ධන අධිකාරිය / ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සඳහා ඉඩම් 50 ක් පැවරීම	145%		
සුනාමි දීමනාපත්‍ර 100 ක් ලබාදීම	145%		
පූජාභූමි දීමනාපත්‍ර 50 ක් ලබාදීම			64%
නියාදන සාධන පත්‍ර 50 ක් සකස් කිරීම			34%
ජංගම සේවා වැඩසටහන් 200 ක් පැවැත්වීම			6.5
කච්චේරි 375 ක් පැවැත්වීම			9.6
රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට දත්ත 70000 ක් ඇතුලත් කිරීම	169.59		
පරම අයිතිය සහිත ප්‍රදාන පත්‍ර			55.35
ගැටළු වලට උපදෙස් ලබාදීම හා ගැටළු නිරාකරණය			51.16

5. පරිච්ඡේදය
තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
(තිරසාර සංවර්ධන අරමුණු 1.4) විශේෂයෙන්ම දරිද්‍රතාවයෙන් පෙලෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියළුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපල උරුමයන්, ස්වභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම	ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීම	බලපත්‍ර 38200 ක් සකස් කිරීම.		51.86	
	පරම අයිතිය සහිත ප්‍රදාන පත්‍ර 40000	22138		55.35	
	රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට දත්ත ඇතුළත් කිරීම 70000	118693 (උරුමය වැඩසටහනට අදාලව හා සාමාන්‍ය පරිදි පද්ධතියට ඇතුළු කිරීම)		169.56	

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2024 වර්ෂයේ දී ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීමේ ඉලක්කය 38200 ක් වූ අතර ප්‍රගතිය 51.86% ක් විය. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර සකස් කිරීමේ ඉලක්කය 2000 ක් වූ අතර ප්‍රගතිය 7,050 ක් විය. එමෙන්ම රාජ්‍ය ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතිය ඔස්සේ බලපත්‍ර සකස් කිරීමේ ඉලක්කය 70,000 ක් වූ අතර ප්‍රගතිය 36,044 ක් සහ දීමනා පත්‍ර සකස් කිරීමේ ඉලක්කය 14,000 ක් වූ අතර ප්‍රගතිය 6367 ක් විය.

රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් නිකුත් වූ චක්‍රලේඛ සඳහා අනුකූල වෙමින් පවත්නා සීමිත ප්‍රතිපාදන තුළ 2023 වර්ෂයේදී සැලසුම් කරන ලද ඉලක්කයට ලඟාවීමට තරමක් අපහසු විය.

6. පරිච්ඡේදය
මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	කොන්ත්‍රාත් පදනම මත	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	95	36	-	59
තෘතීක	38	5	-	33
ද්විතියික	710	458	9	252
ප්‍රාථමික	121	92	-	29
	964	591	9	373

- ජ්‍යෙෂ්ඨ මට්ටම යටතේ පවතින තනතුරු නාම ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස්, ප්‍රධාන ගණකාධිකාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණක, සහකාර ඉඩම් කොමසාරිස්, ගණකාධිකාරි, මිනින්දෝරු, නීති නිලධාරි තනතුරු ඇතුළත් වේ.
- තෘතීක මට්ටම යටතේ පවතින තනතුරු නාම ලෙස පරිපාලන නිලධාරී, ජනපද නිලධාරී (විශේෂ), ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි, භාෂා පරිවර්තක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරු ඇතුළත් වේ.
- ද්විතියික මට්ටමේ පවතින තනතුරු ලෙස සංවර්ධන නිලධාරී, වැඩ අධිකාරි, ජනපද නිලධාරි, කළමනාකරණ සේවා නිලධාරි, ක්ෂේත්‍ර උපදේශක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර ඇතුළත් වේ.
- ප්‍රාථමික මට්ටම යටතේ පවතින තනතුරු ලෙස රියදුරු, කාර්යාල කාර්ය සහායක, කාර්යාල කම්කරු, සංචාරක බංගලා භාරකරු, සංචාරක බංගලා කම්කරු, මැනුම් සහායක, මුරකරු යන තනතුරු ඇතුළත් වේ.

මෙම වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම දෙපාර්තමේන්තුවෙහි කාර්ය මණ්ඩලයට අදාළ තනතුරු යාවත්කාලීන කරන ලදී.

ඒ අනුව ද්විතියික මට්ටමේ පවතින තනතුරක් ලෙස පැවති සමාජ විද්‍යාඥ තනතුර සහ ලේඛන භාරකරු තනතුර යටපත් කර ඇති අතර ප්‍රාථමික මට්ටම යටතේ පවතින තනතුරු වන මෝටර් කාර්මික හා ගබඩා භාරකරු යන තනතුරු දෙක යටපත් කර ඇත. එසේම ද්විතියික මට්ටමේ පවතින තනතුරක් ලෙස ක්ෂේත්‍ර උපදේශක තනතුර හා ප්‍රාථමික මට්ටම යටතේ පවතින තනතුරු වන කාර්යාල කම්කරු හා මුරකරු යන තනතුරු දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇති අතර නිලධාරියා විශ්‍රාම යාමෙන් හෝ වෙනත් හේතුවක් නිසා හෝ පුරප්පාඩු වීමෙන් තනතුර අහෝසි වන ලෙස එම තනතුරු යාවත්කාලීන කර ඇත.තව ද දැනට ද්විතියික මට්ටමේ පවතින තනතුරක් ලෙස පැවති වැඩසටහන් නිලධාරී තනතුරු නාමය “සංවර්ධන නිලධාරී” ලෙස සංශෝධනය කර ඇත.

6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපෑ ආකාරය

ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් දිගින් දිගටම ඉල්ලීම් කර ඇතත් සියළු පුරප්පාඩු පුරවාගත නොහැකි වී ඇත. එමෙන්ම දෙපාර්තමේන්තුගත පත්කිරීම්වල ද සැලකිය යුතු පුරප්පාඩු ප්‍රමාණයක් පවති. ඊට මූලිකවම හේතු වී ඇත්තේ ජනපද නිලධාරීන්ගේ පුරප්පාඩු ප්‍රමාණය වේ.ඒ අනුව ජනපද නිලධාරී තනතුරෙහි පවතින පුරප්පාඩු වලින් 70% ක් විවෘත පදනමින් සම්පූර්ණ කරගත යුතු පුරප්පාඩු බැවින් එකී පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස ඉල්ලා අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත අදාල ඉල්ලීම ඉදිරිපත් කරන ලද නමුත් ඊට අනුමැතිය ලැබී නොමැති බැවින් එකී පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත.

දෙපාර්තමේන්තුවේ දැනට සිටින නිලධාරීන් අතර දෙපාර්තමේන්තුවට අයත් රාජකාරී ප්‍රමාණය බෙදීයාම හේතුවෙන් නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය, ඵලදායීතාවයට යම් අහිතකර බලපෑමක් ඇති වී ඇති අතර, මෙම මානව සම්පත් හිඟය මහ හරවා ගත හැකි නම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය තවදුරටත් ඉහළ නැංවීමට ඉවහල්වනු ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය (2024)

අනු අංකය	පුහුණු වැඩසටහනේ නම	පුහුණුවලත් නිලධාරීන් සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රුපියල්)		වැඩසටහනේ පරමාර්ථය
				දේශීය	විදේශීය	
1	මාණ්ඩලික නිලධාරීන් සඳහා පශ්චාත් උපාධි පාඨමාලාව	06	වර්ෂ 02	985,000	-	සේවා ව්‍යවස්ථාව අනුව නිලධාරීන්ගේ උසස්වීම් සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා
2	දෙමළ භාෂා පාඨමාලාව	21	මාස 06	48,214	-	රජයේ නිලධාරීන්ට දෙමළ භාෂාව සම්බන්ධයෙන් දැනුමක් ලබාදීම
3	දෙමළ භාෂා පාඨමාලාව (කා.සේ.සේ)	2	මාස 06	3,000	-	රජයේ නිලධාරීන්ට දෙමළ භාෂාව සම්බන්ධයෙන් දැනුමක් ලබාදීම
4	රථ වාහන නීතිය හා මාර්ග අනතුරු සම්බන්ධයෙන් රියදුරු පුහුණු වැඩසටහන සහ යාන්ත්‍රික පුහුණුව පිළිබඳ රියදුරු පුහුණු වැඩසටහන	12	පැය 03	600	-	රථ වාහන නීතිය හා මාර්ග අනතුරු සම්බන්ධයෙන් රියදුරු දැනුවත් කිරීම සහ යාන්ත්‍රික කටයුතු පිළිබඳ දැනුමක් ලබාදීම
5	රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	65	පැය 02	1,420	-	නිලධාරීන් හට රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුමක් ලබාදීම
	එකතුව			**1,047,234**		

7. පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)			
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.6	වෙනත්			
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ.	මේ සඳහා දෙපාර්තමේන්තුව විසින් සකස් කර ගත් ආකෘතියකට අනුව නොතුරු යාවත්කාලීන කර පවත්වාගෙන යයි.	ඉදිරියේදී GA-N20 ලේඛණය මඟින් නොරතුරු යාවත්කාලීන කිරීමට පියවර ගනු ලැබේ.
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	-		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		1.වාරික වශයෙන් අයකරනු ලැබේ. 2.අයකිරීමට කටයුතු කරමින් පවති.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල නොවේ		ඉදිරියේදී මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් දී ඇත.
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		

15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ		සකස් කරමින් පවති.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		

19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	මානව සම්පත් සැලැස්මට ඇතුලත් කර ඇත. මෙම වර්ෂය තුල නිකුත් වූ වියදම් පාලනය සම්බන්ධයෙන් වන චක්‍රලේඛ අනුව පුහුණු අවස්ථා පැවැත්වීමට අවශ්‍ය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් තිබූ අවකාශය සීමා වීම.	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ARI/E/LCGD/FA/2/24/14 මෙම අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 මැයි 30 දින

ගණන්දීමේ නිලධාරි

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්,මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ,මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත.එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ,මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත.මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුවෙහි වාර්ෂික වියදම 2023 සහ 2024 වර්ෂ වල කාර්යසාධන වාර්තාව අනුව වෙන්කල මූලධන හා පුනරාවර්තන ප්‍රතිපාදනය පිළිවෙලින් රු.651,800,000 ක් හා රු.750,960,000 ක් වූ අතර සමස්ත වියදම පිළිවෙළින් රු.562,044,842 ක් හා රු.616,701,021 ක් විය.දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂයේ සිට 2024 දක්වා වර්ෂ 04 ක කාලය තුළදී බදු ආදායම පිළිවෙලින් රු.105,312,901 ක්, රු.113,025,610 ක්, රු.150,083,569 ක් හා රු.148,382,339 ක් වී තිබුණි.ඒ අනුව මුල් වර්ෂයන් තුලදී බදු ආදායමෙහි වර්ධනයක් පෙන්නුම් කළද 2024 වර්ෂයේ යම් අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) මුදල් රෙගුලාසි අංක 460 විධිවිධාන අනුව රැස් කරනු ලබන ආදායමේ යම් දෝෂයක්, අඩුපාඩුවක් සිදු වුවහොත් එම දෝෂය ඇතිවූ වහාම හා මුදල් වර්ෂයේ භාණ්ඩාගාර පොත් පියවීමට පෙර නිවැරදි කළ යුතු අතර එසේ නිවැරදි නොකරන ලද දෝෂ නිසා එම වර්ෂයේ ගිණුම් මගින් වැරදි ආරෝපණයක් පෙන්නුම් කරනු ලැබේ.සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ඉඩම් හා අනෙකුත් බදු කුලී ආදායම වන රු.150,452,937 ක් තුළ පළාත් සභා ආදායමට බැර විය යුතු ආදායම් රු.188,825 ක් වැරදීමකින් ඇතුළත් වීම හේතුවෙන් දෙපාර්තමේන්තු සත්‍ය ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) විගණනය වෙත ලැබුණු තොරතුරු අනුව අන්තර් පළාත් කාර්යාල 08 හි 2024 දෙසැම්බර් 31 දින වන විට හිඟ ඉඩම් බදු ආදායම රු.මිලියන 386.73 ක් වූ අතර ඒ තුළ වර්ෂ 03 කට වඩා වැඩි හිඟ බදු කුලිය රු.මිලියන 237.08 ක් හෙවත් සියයට 61 ක් වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය වන විට හිඟ බදු වටිනාකමින් වර්ෂය තුළදී අයකර ගෙන තිබුණු වටිනාකම රු.මිලියන 14.88 ක් හෙවත් සියයට 3.8 ක් විය. ඒ අනුව හිඟ බදු අයකර ගැනීමේ ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) 2024 දෙසැම්බර් 31 දිනයට හිඟ ඉඩම් බදු කුලී ආදායමින් පොළොන්නරුව සහ අම්පාර කාර්යාල වෙනුවෙන් පමණක් පිළිවෙලින් රු.මිලියන 113.59 ක් හා රු.මිලියන 193.56 ක් ලෙස එකතුව රු.මිලියන 307.15 ක් විය.හෙවත් සියයට 79 ක් විය. නියදි විගණනය අනුව පොළොන්නරුවෙහි බදු දී ඇති ඉඩම් බදුකරුවන් සංඛ්‍යාව 445 ක් වූ අතර එයින් රු.400,000 කට වඩා හිඟ බදුකරුවන් 77 ක් වූවත් මෙම බදුකරුවන් සම්බන්ධයෙන් හිඟ බදු අයකර ගැනීමට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. කෙසේ නමුත් දෙබරවැව අන්තර්පළාත් කාර්යාලයට අයත් බදුකරුවන් 14 දෙනෙකු සම්බන්ධයෙන් පමණක් හිඟ බදු අයකර ගැනීමට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) බදුකරුවන් නියමිත දිනට බදු නොගෙවීම, බද්ද ක්‍රියාත්මක වන නීත්‍යානුකූල දිනය භුක්තිය භාරදුන් පසුව සිදුවීම, ඒ සඳහා වසර ගණනාවක් ගතවීම වැනි කරුණු හිඟ බදු වටිනාකම රු.මිලියන 386.73 ක් දකවා වැඩිවීමට හේතු වුවද දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මෙම ගැටලුකාරී තත්ත්වයන් නිවැරදි කිරීමට බදු පැහැර හරින අය සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමක් සිදුවිය යුතු වේ. දෙපාර්තමේන්තුව මගින් 2020.05.20 දින නිකුත් කරන ලද අංක 2020/06 දරන වක්‍රලේඛය මගින් හිඟ බදු අයකිරීම ප්‍රවර්ධනය උදෙසා දඩ පොලිය සඳහා සහන ලබා දීමට අදාළව බදු සහන ලබා දීමට අදාළ උපදෙස් ලබා දීමක් සිදුකර තිබුණි. එම වක්‍රලේඛයේ සඳහන් ප්‍රතිපාදනවලට අනුව බදු සංශෝධනය කිරීමෙන් අනතුරුව බදු ආදායම වැඩි වූ ආකාරය පිළිබඳ විස්තර විගණනය වෙත ඉදිරිපත් වී නොතිබුණි.බදු සංශෝධනය කිරීම නිසා සිදුවූ තත්ත්වයන් පිළිබඳ අවබෝධ කර ගැනීම සඳහා 2025.02.14 දිනැති අංක ARI/E/LCGD/SA/02/23/INF/18 ලිපිය යොමු කලද ඒ සඳහා අවශ්‍ය පිලිතුරු ලබා දී නොතිබුණි.

(ඊ) නිල නිවාස පවත්වාගෙන යාම හා ඒවායේ කුලී ගාස්තු නොගෙවූ අවස්ථාවන් සම්බන්ධයෙන් විගණනයට තොරතුරු ඉදිරිපත් නොවිය. 2021 ජනවාරි 01 දින නිල නිවාසය භාරගත් ඉඩම් කොමසාරිස්වරයා (හිටපු) 2022 මාර්තු 31 දින දක්වා වූ රු. 188,700 ක කුලී ගාස්තුව ගෙවීම් කර නොතිබුණි. 2025 අප්‍රේල් 30 දින වන විට එම කොමසාරිස්වරයා විශ්‍රාම ගොස් ඇති බැවින් නොගෙවා ඇති නිල නිවාස කුලිය ගෙවීම් කරන ලෙස දන්වා තිබුණි. රජයට අයවිය යුතු ආදායම් නිසි පරිදි අය නොකිරීම සම්බන්ධව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 142,143 වගන්ති ප්‍රකාරව කටයුතු නොකළ නිලධාරීන් වගකීමට යටත් වන අතර අදාළ මුදල් රෙගුලාසි පරිදි හිඟ මුදල් අයකරගෙන විගණනය වෙත ඒ සම්බන්ධ තොරතුරු වාර්තා කිරීමටද කටයුතු කළ යුතුවේ.

(උ) 1976 අංක 27 දරන සංශෝධිත ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 3(ඒ) වගන්තිය යටතේ සංස්ථාවට පවරාගන්නා ලද ඉඩම් කොටස් සංවර්ධනය කර වෙනත් ආයතන වෙත බැහැර කර ඇත්නම් අදාළ ඉඩම් කොටස් සංවර්ධනය කිරීමට ප්‍රථම පැවති නොදියුණු වටිනාකම ඉඩම් කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතු බව එම පනතේ 4(බී) වගන්තිය ප්‍රකාරව සඳහන්ව ඇති බව 2016 දෙසැම්බර් 22 දිනැති අංක එල්ඒ 527 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරයා විසින් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමු කරන ලද ලිපියක සඳහන් විය. ඒ අනුව වර්ෂ කිහිපයක සිට ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් සංවර්ධනය කර බාහිර පාර්ශ්වයන් වෙත බැහැර කර ඇති ඉඩම් අක්කර 321 පර්චස් 3.03 කට අදාළව ඉඩම් සංවර්ධනය කිරීමට පෙර පැවති නොදියුණු වටිනාකම වූ රු. මිලියන 59.78 ක මුදල දෙපාර්තමේන්තුව විසින් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය

3.2 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ලේඛනය සැකසීමේදී ඇස්තමේන්තු නිසි අධ්‍යයනයක් මත සිදු නොවීම නිසා 2024 වර්ෂය වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි. ඒ අනුව මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණව හා නිවැරදිව පිළියෙල කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන වැය විෂයයන් 14 ක් සඳහා වූ රු.75,400,000 ප්‍රතිපාදනයෙන් රු.31,431,554 ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. එම ඉතිරිවීම් මුලු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ත් සියයට 82 ත් අතර පරාසයක පැවතුණි. එසේම මූලධන වැය විෂයන් 03 කට අදාල මුලු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.56,000,000 කින් ඉතිරිය රු. 36,530,286 ක් වී තිබිණි. එම ප්‍රතිපාදන ඉතිරිවීම් සියයට 20 ත් සියයට 78 ත් අතර පරාසයක පැවතුණි.

3.3 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන් පරිදි වේ.

	නීති රීති හා රෙගුලාසිය	**අනුකූල නොවීම**
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 135 වගන්තිය, භාණ්ඩාගාර ලේකම්ගේ 2022 නොවැම්බර් 25 දිනැති අංක 08/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා 2024 ජනවාරි 10 දිනැති 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය.	2024 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් දරන ලද වියදම් සම්බන්ධයෙන් රජයේ වියදම් පාලනය කිරීම සඳහා උපදෙස් ලබා දී ඇති චක්‍රලේඛ හා නීති රීති රෙගුලාසි පිළිබඳ සැලකිල්ලක් නොදක්වා ඇතැම් වියදම් දරා තිබුණි.උදාහරණ ලෙස නිලධාරීන් සඳහා ආහාරපාන ලබා ගැනීම, නවාතැන් පහසුකම් ලබා ගැනීම, දේශපාලන රැස්වීම් සඳහා ඉන්ධන හා රජයේ වාහන ලබා ගැනීම ආදී කරුණු සඳහා විගණනය විසින් සිදු කරනු නියදි පරීක්ෂණයන්ට අනුව නීති රීති රෙගුලාසි වලට පටහැනිව දරා ඇති වියදම් රු.2,374,654 ක් වී තිබුණි.
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**	
	i. XXIV පරිච්ඡේදයේ 4.2.5 වගන්තිය හා 2017 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 262/2017 හි 4 වන වගන්තිය	ආපසු ගෙවා අවසන් කර නොමැති ණය මුදලින් අයකර ගැනීමට ඉතිරිව තිබෙන මුදල් නිලධාරීන්ගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂික මුදල්වලින් අයකර ගත යුතු අතර 2018 වර්ෂයේ හා ඉදිරි වර්ෂවල විශ්‍රාම පාරිතෝෂික ලබාදී ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිදු ශේෂයක් නොනිබීමට වගබලා ගත යුතු බව සඳහන් වුවද වාර්තාව ඉදිරිපත් කරන දිනට විශ්‍රාම ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය රු.87,058 ක් විය.
	ii. ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 සහ 4.6 වගන්ති	i. සේවය අතහැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් වර්ෂ 01 ත් 03 ත් අතර පවතින හිඟ ණය ශේෂය රු.166,354 ක් විය. ii. වැඩ තහනම් කළ නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු එකතු ණය ශේෂය රු. 211,766 ක් වූ අතර එම ණය ශේෂය තුළ වර්ෂ 05 ට වැඩි ණය ශේෂ රු.132,116 ක් සහ වර්ෂ 03 ත් 05 ත් අතර ණය ශේෂය රු.79,650 ක් විය.

iii.	ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 10 වගන්තිය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අංක 21/2013	සති අන්ත හා රජයේ නිවාඩු දින වල වැඩ කිරීම වෙනුවෙන් මුදල් ගෙවීමේදී ලිත් මාසයකට දින 02 කට වඩා වැඩි ගණනක් සේවයේ යෙදවීම අවශය වන්නේ නම් අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය පෞද්ගලිකව ලබා ගත යුතු නමුත් නියදි විගණනය අනුව දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් 08 දෙනෙකු 2024 ජනවාරි මාසයේදී දින 04 හෝ ඊට වඩා වැඩි දින ගණනක් සති අන්ත හා රජයේ නිවාඩු දිනවල සේවයේ යෙදීම වෙනුවෙන් ජනවාරි මාසය සඳහා පමණක් නිවාඩු දින වැටුප් ලෙස රු.152,555 ක් ගෙවා තිබුණි. ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර රාජකාරියට වාර්තාකළ හා පිටවූ වේලාවන් සාමාන්‍ය රාජකාරී වේලාවන් අදාළ කර ගෙන නොතිබුණු බවත් නිරීක්ෂණය විය.
(ඇ)	2017 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය ගිණුම් වක්‍රලේඛ අංක 262/2017 හි 4 වගන්තිය	2018 වර්ෂය හා ඉදිරි වර්ෂවල මරණ පාරිතෝෂික ලබාදී ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිදු ණය ශේෂයක් තම ආයතනවල අත්තිකාරම් බී ගිණුමේ ඇතුළත් නොවීමට ආයතන ප්‍රධානීන් විසින් වගබලා ගත යුතුය යන්න සඳහන් කර තිබුණද 2024 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01ට අඩු කාලයක් තුල මිය ගිය නිලධාරීන් දෙදෙනකුගෙන් අයවිය යුතු 243,448.00 ක ණය ශේෂයක් සහ වර්ෂ 01 – 03 අතර මියගිය එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.296,600 ක ණය ශේෂය විගණිත දින වන 2024 දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි.
(ඇ)	2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය	දෙපාර්තමේන්තුව විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර එය මහජනයාට විවෘත වන පරිදි ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.4 **අවධිමත් ගණුදෙනු**

(අ) ගාල්ල සමනල ක්‍රීඩාංගනයේ 2024 ජුනි 14 දින පැවති ප්‍රදර්ශනය සඳහා යාමට සහ ඒමට ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් වැය වූ ඉන්ධන ප්‍රමාණය ප්‍රතිපූර්ණය කිරීමට වවුවර් අංක 62/06 මගින් රු.12,630 කට අදාළව ඉන්ධන ලීටර් 40 ක් ලබාගෙන තිබුණි.එය රාජකාරී අවශ්‍යතාවයක් ලෙස සඳහන් කලද මෙම ප්‍රදර්ශන භූමිය මගින් ජනතාවට සේවාවන් ඉටු වූයේ නම් එම ලබාදුන් සේවාවන් පිළිබඳව විගණනයට අනාවරණය නොවන අතර දෙපාර්තමේන්තුවෙහි ස්ථිර කාර්ය මණ්ඩල, වාහන යොදවමින් හා වියදම් දරමින් සිදුකර ඇති සේවාවන් පිලිබඳව පවතින ලිපිගොනුව විගණනයට ඉදිරිපත් නොවීය.

3.5 **තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම**

මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් ගෙවන නිලධාරියා විසින් ස්වකිය අතුරු අග්‍රිමය පිළිබඳ ගණන් හිලව් ඉදිරිපත් කළ යුතු අතර අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවත් 2024 වර්ෂයේ අවස්ථා 11 කදී නිකුත් කරන ලද එකතු වටිනාකම රු. 394,210.00 ක් වූ අග්‍රිම නියමිත දිනට පියවා නොතිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

4.1.1 **දැක්ම හා මෙහෙවර**

ජාතික ප්‍රතිපත්තියක් තුල මනා සම්බන්ධීකරණයකින් යුතුව සංවර්ධනයේ විරස්ථායී බව සහතික කරමින් රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් සහතික කිරීමට මහ පෙන්වමින් නිරවුල් බිමක අයිතිය තහවුරු කෙරෙන විධිමත් කළමනාකාරිත්වයක් පවත්වා ගෙන යෑම දෙපාර්තමේන්තුවේ 'මෙහෙවර' ලෙස දක්වා ඇතත්, ඉඩම් පිළිබඳ තොරතුරු හා දත්ත ලබාගැනීමේදී දෙපාර්තමේන්තුව තුළ බදුදීම්, ඉඩම් බැහැර කිරීම්, දීමනාපත්‍ර ලබාදීම, බදු නිදහස් කිරීම, බදු සහන ආදී තොරතුරු ලබා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් විගණිත දිනය වන 2025 අප්‍රේල් 30 දින වන විටද පවත්වා නොතිබුණි.

4.1.2. **සැලැසුම් කිරීම**

(අ) 2024 වර්ෂයන්හි ඉලක්කගත දත්ත කාර්යය සාධන වාර්තා තොරතුරු අනුව E-slims පද්ධතිය මගින් සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර 2,000 ක් , දීමනා පත්‍ර 40,000 ක් නිකුත් කිරීමට හා දීර්ඝකාලීන බදු 1,000 ක් පද්ධතියට ඇතුළත් කිරීමට සැලසුම් කර තිබුණද 2024 දෙසැම්බර් 31 වන විට බලපත්‍ර 917 ක් හා දීමනා පත්‍ර 22,432 ක් නිකුත් කර ඇති අතර බදුකර 152 ක් ඇතුළත් බවට විගණනය වෙත වාර්තා කර තිබුණි. ඒ අනුව එහි ප්‍රගතිය පිළිවෙලින් සියයට 46 ක් හා 56 ක් හා 15 ක් වී තිබුණි.

(ආ) ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් හා අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරුන් වෙත 2023 දෙසැම්බර් 31 වන දිනට ප්‍රථම සියලුම බදු අනුමැතීන් සහ සියලු බදුකර සම්බන්ධ තොරතුරු E-slims පද්ධතියට ඇතුළත් කරන ලෙස උපදෙස් දී තිබුණි. බදු දී ඇති ඉඩම් කොපමණද යන්න විගණනයට තොරතුරු නොලැබුණු අතර E-slims පද්ධතිය මගින් ලද තොරතුරු අනුව දිර්ඝකාලීන බදු ඉඩම් 7,517 ක තොරතුරු , පද්ධතියට ඇතුළත් කර තිබුණි. නමුත් විගණිත දිනය වන විටත් රජයේ ඉඩම් බදු දීම තුළින් ඉපයූ අදායම හා හිඟ බදු ආදායම් පිළිබඳ වාර්තා පද්ධතිය තුළින් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) පසුගිය වර්ෂයෙහි ක්‍රියාකාරී සැලැස්ම අනුව බදු ගෙවීම් ඇතුළු අනෙකුත් කාර්යයන් මාර්ගගත ක්‍රමයට සිදු කිරීමට බැංකු ගිණුම් 10 ක් මගින් සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධ කිරීමට සැලසුම් කර තිබුණි. 2013 වර්ෂයේ ආරම්භ වූ මෙම E-slims පද්ධතිය දැනට වසර 11 ක් ගත වී ඇතත් නියමිත පරිදි බදු නිර්දේශ ලබා දී , බදු අනුමැතිය ලබා දීම හා බදු ගෙවීම මාර්ගගත ක්‍රමය මගින් සිදු කර ගැනීමට 2024 දෙසැම්බර් 31 දින වන විට නොහැකි වී තිබුණි.

4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) ඉඩම් බදු දීම හා සම්බන්ධ කාර්යක්ෂම සේවාවක් සැපයීම අරමුණු කරගෙන රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (E-slims) ආරම්භ කර වර්ෂ 05 ක කාලයක් තුළදී පද්ධතියෙහි වැඩ අවසන් කර ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 119.6 ක් ඇස්තමේන්තු කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1 වන පරිවර්ජේදයේ 1.1 හා 1.2.1 ඡේදයන්හි සඳහන් වන පරිදි ක්‍රියාත්මක නොවී E-slims පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් අරායා බිස්නස් සොලියුෂන් පුද්ගලික සමාගම වෙත 2013 වර්ෂයේ සිට 2024 වර්ෂය අවසාන වන විට රු 41,569,500 ක මුදලක් ගෙවීම් කර තිබුණි. 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මිලදී ගත් රු.130,217,574 ක් වටිනා උපකරණ වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ටැබ් යන්ත්‍ර, පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් හා අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය වෙත ගිවිසුම්ගත නොවී පවරා ඒවාට අන්තර්ජාල පහසුකම් ලබාදීම සඳහා 2024 වර්ෂය තුළදී ශ්‍රී ලංකා මොබිටෙල් ආයතනය,ඩයලොග් ආයතනය,හා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත රු.1,754,814 ක්ද අන්තර්ජාල පහසුකම් සඳහා දැනට දරා ඇති මුළු මුදල රු.36,473,038 ක් වී තිබුණි. නිලධාරීන් දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් වසර ගණනාවක සිට විශාල මුදලක් වැය කර තිබුණි. 2025 අප්‍රේල් 10 දින වන විටත් මෙම පද්ධතිය මගින් ලබා ගැනීමට බලාපොරොත්තු වූ කාර්යසාධන මට්ටම් ළඟා කර ගැනීමට නොහැකි වුවද දරා ඇති වියදම රු.226,898,239 ක් විය.2025 මාර්තු 24 දිනැති අංක LCGD/e-slims/online module දරන ලිපිය ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ශ්‍රී

ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයෙහි ප්‍රධාන විධායක නිලධාරිවරයා වෙත යොමු කරමින් එම ආයතනයෙන් පද්ධති විගණනයක් සිදුකර දෙන ලෙස ඉල්ලා තිබුණි. 2024 වර්ෂයේ දී පුද්ගලික සමාගම සමඟ ඇති කරගත් ගිවිසුමක ඡායා පිටපතක් විගණනය වෙත ඉදිරිපත් කළ අතර එම ගිවිසුම 2024 ජනවාරි 12 ආරම්භ වී 2025 ජනවාරි 11 දින වනවිට අවසන් වන බව සඳහන් විය. මෙම ගිවිසුම අනුව පද්ධතියේ වැඩිදියුණු කිරීම සම්බන්ධ කරුණු සඳහන් කර නොමැති අතර කොන්ත්‍රාත්කරුට වාසිදායක තත්ත්වයක් අත්වන ආකාරයට ගිවිසුම් ගත වී තිබුණි. E-slims පද්ධතිය ඉඩම් කොමසාරිස් ජනරාල් යටතේ වන පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් පවත්වා ගෙන යනු ලබන අතර ජනපද නිලධාරියකු සහ සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු ද මෙම ව්‍යාපෘතිය සඳහා යොදවාගෙන තිබුණි. තොරතුරු තාක්ෂණය සම්බන්ධ දැනුම ඇති කණ්ඩායමක් වෙත වගකීම පැවරීමකින් හා සැලැස්මකින් යුතුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

- ආරම්භක අවස්ථාවේදී ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමකින් තොරව පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීම.
- රාජ්‍ය ආයතනයකට අදාළව සිදු කරනු ලබන කාර්යයන්හිදී බාහිර පාර්ශ්වයන් සමග කටයුතු කරන සෑම අවස්ථාවකදීම රජය බලාපොරොත්තු වන කාර්යභාරය මොනවාද, කාර්ය ඉටුවිය යුතු කාලසීමාව කුමක්ද, ගෙවීම් කරන ආකාරය කෙසේද යන්න හා වැදගත් යැයි හැඟෙන අනාගතයේදී නීතිමය තත්ත්වයන් මතු වුවහොත් ඒ සඳහා ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි විධිමත් ගිවිසුම් හා TOR (terms of reference) යොමු කිරීමේ ආදේශ ඇතුළත් නීත්‍යානුකූල එකඟතාවයන්ට එළඹිය යුතු වුවත් ඒ අයුරින් කටයුතු නොකිරීම.
- පද්ධතිය ක්‍රියාත්මක වන ආකාරය දක්වමින් සංයුක්ත සැලැස්මක් හෝ ක්‍රියාකාරී සැලැස්මක් සකස් නොකිරීම.
- මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට තරම් ප්‍රමාණවත් හා දැනුම ඇති නිලධාරීන් පත් නොකිරීම සහ වගකීම් පැවරීමට කටයුතු නොකිරීම.

4.2 වත්කම් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුව සතුව පවතින සංචාරක බංගලා හා පැරණි නිල නිවාස අලුත්වැඩියා කර සංචාරක බංගලා බවට පත්කර ඇතත් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම් ගත කර ඇති වටිනාකම රු.32,949,195 ක් විය. මෙම සංචාරක බංගලා පිහිටි ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමක් කර වර්තමාන වටිනාකම් ලබාගැනීමට,ඒවායේ අයිතිය විධිමත්ව පවරාගැනීමටත් ඒ සඳහා පිඹුරුපත් සකස් කිරීමත් සිදු කර නොමැති අතර ගොඩනැගිලි සැලසුම්ද සකස් කර අනුමැතීන් ලබාගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) රත්මලාන ආහාර ගබඩාවකට අයත් ගොඩනැගිල්ලක් 2015 වර්ෂයේදී ලබාගෙන ඒ සඳහා 2016 හා 2017 යන වර්ෂවලදී දරා තිබුණු මුළු අලුත්වැඩියා වියදම රු.4,594,661 ක් විය. එහි පවතින භාණ්ඩ වටිනාකම ආසන්න වශයෙන් රු.12,990,170 ක් පමණ විය. වට්ටෝරු පොතේ සඳහන් උපකරන 34 ක් පැවතියද එහි මිලදිගත් වටිනාකම විගණනය වෙත ඉදිරිපත් නොවූ අතර ඒවා ප්‍රයෝජනයට නොගන්නා බව නිරීක්ෂණය විය. එම ශ්‍රවනාගාරයට රු.2,610,000 ක් වටිනා පුටු 200 ක ප්‍රමාණයක් සපයා තිබුණද 2021 වර්ෂයේ වැඩමුලු 08 ක් හා 2022 දෙසැම්බර් 16 දින එක් වැඩමුලුවක් පමණක් පවත්වා තිබුණි. එම ස්ථානයේ තබා තිබුණු පරිගණක යන්ත්‍ර 04 න් 03 ක් ක්‍රියා විරහිත තත්වයේ පැවතුණි. විශාල ප්‍රමාණයේ වායු සමීකරණ යන්ත්‍ර 04 ක් සවිකර ඇතත්,භාවිතයක් නොමැති වීම නිසා අභ්‍යන්තරයේ ඇති කොටස්වල මල බැඳී භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වීමේ අවස්ථාවන් නිරීක්ෂණය විය.ගොඩනැගිල්ලේ කොටසක අංග සම්පූර්ණ පරිගණක මධ්‍යස්ථානයක් ඇතිකර ඇති අතර සමාලෝචිත වර්ෂයේ රු.5,580,000 ක් වැය කරමින් මිලදීගත් පරිගණක උපකරණ 20 ක් ද එම මධ්‍යස්ථානය වෙත ලබාදී තිබුණද 2025 ජනවාරි 06 දින වන විට එහි පරිගණක සහ උපාංග 42 ක ප්‍රමාණයක් පැවතියද එම උපකරණ භාවිතට නොගෙන නිශ්කාර්යව තබා තිබුණි.මෙම ගොඩනැගිල්ල සහ උපකරණ ආරක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ කාර්යාල කාර්ය සහායකවරයෙකු රාජකාරී කටයුතු සඳහා අනුයුක්ත කර 2020 පෙබරවාරි 25 දින සිට සේවයේ යොදවා ඇති අතර එදින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ වැටුප් හා දීමනා ලෙස රු.3,042,240 ක් ගෙවීම් කර තිබුණි. මෙම මුදල් වැය කිරීම ආර්ථික භාවයෙන් තොරව රජයේ මුදල් වැය කිරීමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 411 කින් 2024 වර්ෂයේදී අය කරගෙන ඇති නිවාස කුලී පිළිබඳ විස්තර විගණනය වෙත ඉදිරිපත් නොවුණි. නීත්‍යානුකූල ක්‍රමවේදයක් මත නිල නිවාස කුලී පදනම මත ලබා නොදීම, නිල නිවාසවල හා එම භූමියේ අනවසර පදිංචිකරුවන් ඉවත් නොකිරීම, ගොඩනැගිලි අලුත් වැඩියා නොකිරීම,ගොඩනැගිලි පිහිටා ඇති ඉඩම් මැනීම, පිඹුරුපත් සැකසීම, අයිතිය පවරා ගැනීම්, එම මායිම් සැකසීම හා ඉඩම් ආරක්ෂා කිරීම වැනි කරුණු නිසි පරිදි සිදු නොවීම, කුලී ගාස්තු අයවීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. අභ්‍යන්තර විගණන වාර්තාවේ තොරතුරු අනුව පවත්නා නිල නිවාස වලින් 261 ක් තක්සේරු කර ඇති අතර නිවාස 98 ක් සඳහා දළ තක්සේරුව ලබාගෙන තවදුරටත් නිවාස 52 ක් සඳහා තක්සේරු වාර්තා ලබාගත යුතුව තිබුණි. අබලන්වී ඇති නිවාස තක්සේරු වාර්තා ලබා ලබාගත්තද ප්‍රයෝජනයක් නොවන බවද නිල නිවාස 30 ක පමණ අනවසර පදිංචිකරුවන් සිටින අතර වෙනත් රාජ්‍ය ආයතන වෙත පැවරීමට කටයුතු කර ඇති නිල නිවාස සංඛ්‍යාව 35 ක් වන අතර දැනටමත් නිල නිවාස 07 ක් බාහිර ආයතන වෙත පවරා තිබුණි. නිල නිවාස 294 ක් භාවිතා නොකර අභාවයට පත්වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රයෝජනය සඳහා 2021 ජනවාරි 21 දින රු.මිලියන 25.07 ක් වැය කරමින් නිල නිවසක් ඉදිකර තිබුණි. මෙම ගොඩනැගිල්ල ඉදිකරන ලද දිනයේ සිට නඩත්තු කටයුතු සිදුකර නොමැති අතර අභ්‍යන්තර සහ බාහිර බිත්තිවල තින්ත ආලේප කිරීමක් ද සිදුකර නොතිබුණි. තවද නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොකිරීම නිසා දිනෙන් දින මෙම ගොඩනැගිල්ල අභාවයට යන තත්ත්වයක් දක්නට ලැබුණි.

4.3 පාඩු හා හානි

ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් 2018 ජනවාරි 16 දින ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කරමින් මුහුදු වැලි ඉවත් කිරීමේ ගිවිසුමක් 2018 ජනවාරි 16 දින Rhode Neilson A/C නැමති විදේශීය සමාගමක් සමග ගිවිසුමක් අත්සන් කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවෙහි කොන්ත්‍රාත් වටිනාකම ඇ.ඩො.මිලියන 19.9 ක් විය.ඒ අනුව 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ මුහුදු වැලි කියුබික් මීටර් මිලියන 04 ක් කැනීමට හා ගොඩගැසීමට දෙපාර්ශ්වය එකඟ වී තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 6,778.04 ක් වටිනාකමට මුහුදු වැලි අලෙවි කර සංස්ථාව විසින් ආදායම උපයාගෙන තිබුණි. නමුත් 1957 රාජ්‍ය සන්තක ඉඩම් පිළිබඳ ආඥා පනතේ 08 වැනි කාණ්ඩයේ 58 සිට 67 දක්වා වගන්තිවලට අනුව මුහුදු පතුලෙන් යම් ද්‍රව්‍යයක් ලබා ගන්නේ නම් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අනුමැතිය අනුව සිදුකළ යුතු බව සඳහන්ව ඇති අතර ඒ සඳහා ගාස්තුවක් අය කළ යුතු බවද සඳහන් වී තිබුණි. නමුත් රු.මිලියන 6,778.04 ක් වූ වටිනා වැලි ඉවත් කිරීමේදී ලබාගත් අනුමැතියක් හෝ යම් මුදලක් රජයට අයකර ගත් බවට සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි. ඒ අනුව මෙම ක්‍රියාවලියේදී අවම වශයෙන් රු.මිලියන 271.1 කට ආසන්න පාඩුවක් රජයට සිදුවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.4 අනාර්ථික ගණුදෙනු

(අ) කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ 2019 වර්ෂයේ දී ශක්‍යතා අධ්‍යයනයකින්, නිසි සැලසුමකින් හා ප්‍රතිපාදන පවතීද යන්න ගැන සොයා බැලීමකින් තොරව දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරා ගැනීමට පෙර පර්චස් 30 ක බිම් කොටසක් සංචාරක බංගලාවකට ලබාගෙන එම ගොඩනැගිල්ලෙහි කොටසක් පමණක් ඉදිකර තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය කර ඇති මුදල රු. 10,422,503 ක් වූ අතර බංගලාවෙහි ඉදිකිරීම් වැඩ නිම නොකර රු. 327,400 ක ලී බඩු උපකරණද මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත් අතරමඟ ඉදිකිරීම් කටයුතු නවතා දමා ඇති මෙම ගොඩනැගිල්ල නිසි ප්‍රයෝජනයකින් තොරව විනාශ වෙමින් පවතින අතර භාවිතයෙන් තොරව අඩක් නිම වූ මෙම ගොඩනැගිල්ල වැඩ අවසන් කර භාවිතයට ගැනීම සඳහා රාජ්‍ය ආයතන කිහිපයක් විසින් ඉල්ලීම් කර තිබුණි. 2025 ජනවාරි 31 දින වන විටත් කිසිදු කටයුත්තක් සහ ප්‍රයෝජනයට නොගෙන මෙම ගොඩනැගිල්ල වගකීම් පැහැර හැර කටයුතු කරනු ලැබූ නිලධාරීන්ගේ දුර්වල පරිපාලනය නිසා මෙම ගොඩනැගිල්ල අඩක් ඉදිකර වර්ෂ 05 කට ආසන්න කාලයක් ප්‍රයෝජන නොගැනීම රජයේ මුදල් ආර්ථිකභාවය, ඵලදායීව, කාර්යක්ෂමව යෙදවීමට කටයුතු නොකිරීමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) උරුමය ඔප්පු බෙදාදීමේ ජාතික ව්‍යාපෘතිය සඳහා ජනපද නිලධාරීන්ට හා ඉඩම් නිලධාරීන් වෙත මාසිකව රු.2,000 බැගින් 2024 අප්‍රේල් 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා මාස 09 ක කාලයක් වෙනුවෙන් 2024 ඔක්තෝබර් 16 දින වවුවර් අංක 60/10 මගින් රු.1,188,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි. මේ සඳහා ඉඩම් කොමසාරිස්වරයා විසින් 2024 ජුනි 05 දින අංක LCGD/R&D/පොදු/උරුමය/2023 ලිපිය ජනාධිපති ලේකම්වරයා වෙත යොමු කරමින් ප්‍රතිපාදන නිදහස් කරගෙන තිබුණි. නමුත් ඉන්ධන දීමනාවක් හිමි නොවූ නිලධාරීන් වෙත දීමනාව ගෙවීම සඳහා නීතිමය ප්‍රතිපාදන නොමැති අතර මෙම වියදම අනාවර්තික වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.5 කළමනාකරණ දුර්වලතා

(අ) අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වාණිජ පදනමින් දිර්ඝ කාලීන බදු දී ඇති ඉඩම් ගොනු අතරින් 2021 පෙබරවාරි 01 දිනැති අංක 2020/06 (1) චක්‍රලේඛය ප්‍රකාරව දෙවන බදු කාලය ආරම්භ වන,දිර්ඝ කාලීන වාණිජ බදු ගොනු 82 ක් පවතින බව නිරීක්ෂණය වූ අතර ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2022 නොවැම්බර් 10 දිනැති අංක 4/10/ පොදු / බදු සහන (L2) ලිපිය මඟින් බදු ගොණු 08ක් සම්බන්ධයෙන් බදු අයකලයුතු ආකාරය දන්වා තිබීම නිසා රජයට රු.70,518,510 ක බදු මුදලක් අහිමි වී තිබුණි. චක්‍රලේඛය අභිබවා බදු සහන ලබා දීමට කටයුතු කර තිබීම නිසා එකී බදු ගොනු 82 න් බදු ගොනු 74 ක බදුකරුවන් බදු ගෙවීම් අධෛර්යමත් වීමේ අවධානමක් ඇති විය හැකි බව 2023 වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන්නද 2025.04.28 දින වන විටත් නිවැරදි කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) රජයට අයත්ව ඔරුවල වානේ සංස්ථාවට අවශ්‍ය පිරිසිදු නොකරන ලද ජලය කැළණි ගඟෙන් ලබාගැනීම සඳහා නවගමුව ප්‍රදේශයෙන් ඉඩම් අක්කර 01 රූඩ් 03 පර්චස් 9.8 ක් එම කාර්යය සඳහා යොදවාගෙන පසුව රාජ්‍ය වානේ සංස්ථාව 1996 දී කොරියන් සමාගමක් සමග ගිවිසුම්ගත වී සියලුම වත්කම් (ඉඩම්ද ඇතුළුව) එම සමාගම වෙත පවරන ලදි. නමුත් කොරියන් සමාගම රජයේ අවශ්‍යතාවය පරිදි ක්‍රියාත්මක නොවීම නිසා 2009 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් වෙත කොටස් අයිතිය පැවරීමට කටයුතු කර ඇතත් මෙම පෞද්ගලික සමාගම ද විගණිත දිනය වන 2025 පෙබරවාරි 20 දින වන විට විවිධ හේතූන් මත නිෂ්පාදන කටයුතු සිදුකිරීමට නොහැකි තත්වයට පත් වීම මත නවගමුව පොම්පාගාරයේ සිට පිරිසිදු නොකරන ලද ජලය කර්මාන්ත ශාලාව වෙත ගෙන ඒම වසර ගණනාවක සිට නතර වී තිබුණි. එම ඉඩමෙහි ජල පොම්පාගාරයක් ඉදිකර ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමඟ එවකට සිටි කොරියන් සමාගම වන සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රිස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් සමාගම සමඟ 2006 මාර්තු 01 දින සිට වසර 15 කට කුලී ගිවිසුමකට එළඹ මෙම ඉඩම කුලී පදනම මත රු.100,000 ක වාර්ෂික ගාස්තුවක් පළමු වසර 02 තුළ අය කිරීමටද ඉන් පසු ඉදිරි වසර 13 සඳහා වසරකට රු.200,000 බැගින් අය කිරීමට යටත්ව ජල පොම්පාගාරයක් පවත්වාගෙන යාම සඳහා ලබා දී තිබුණි. රජයෙන් විධිමත්ව පවරා නොගත් ඉඩමක් අතුරු බදු දීමෙන් මෙම පුද්ගලික සමාගම කුලී ආදායම් උපයා ගෙන තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව සතු සංචාරක බංගලා 08 ක් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා බාහිර ආයතන වෙත ලබා දී තිබුණි. 2024 දී අනුරාධපුරය සහ නුවරඑළිය සංචාරක බංගලාවන්හි සැලකිය යුතු පිරිසක් නවාතැන් ගෙන ඇතත් අනෙකුත් සංචාරක බංගලා 06 ඉතා අඩු සංඛ්‍යාවක් නවාතැන්ගෙන තිබුණි. මෙම සංචාරක බංගලා පවත්වා ගෙනයාම වෙනුවෙන් දැරීමට සිදුවූ පුනරාවර්තන වියදම රු.5,221,438 ක්වූ අතර ආදායම රු.1,708,455 ක් විය. අඩුම ආදායමක් උපයාගෙන ඇත්තේ හම්බන්තොට සංචාරක බංගලා වන අතර එහි ආදායම රු.40,180 ක් වුවත් ජලය, විදුලිය, දුරකථන ලෙස රු.27,789 ක්ද බංගලා මුරකරුගේ හා කම්කරුගේ වැටුප් ලෙස රු.702,040 ක්ද දරා තිබුණි.දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලින්ගේ දුර්වලතාවයන් නිසා පවතින සංචාරක බංගලාවන්හි ඉල්ලුම අඩුබව සංඛ්‍යාලේඛන අනුව විගණනයේදී නිරීක්ෂණය විය.ඒ සඳහා බලපාන ලද කරුණු ලෙස සංචාරක බංගලා පැරණි ඒවා වීම,නඩත්තු කටයුතු සිදු නොකිරීම,වෙන්කිරීමේ අපහසුතා, ආරක්ෂාව දුර්වල වීම, කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු හා ගාස්තු අයකිරීමේ පවතින විෂමතා සංචාරක බංගලා පවත්වාගෙන යාමේ අරමුණු ඉටු නොවීමට ප්‍රධාන ලෙස බලපා තිබුණි.

(ඇ) ද.ඉ.කු.ග10 අංක 376 කුඹුරු ඉඩම ඩබ්.ඒ ඇන්ටනී වීරසිංහ යන අයට ලබාදීමට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් ඇමතූ 2025 ජනවාරි 09 දිනැති අංක 3/3/හම්/ප්‍රා.ලේ/ලුණු/iii දරන ලිපියෙන් නිර්දේශ කර තිබුණි. එහිදී 1996 නොවැම්බර් 12 දිනැති අංක කිඉ/1/1/ද/10/157 දරන ලිපිය මගින් ඔහු වෙත භුක්තිය භාරදී තිබූ බවට සඳහන් කල ලිපිය ඡායා පිටපතක් බවත්, මුල් පිටපතද ඔහු සතුව නොමැති බවත්, දෙබරවැව ඉඩම් කොමසාරිස් කාර්යාලයේ සහ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේද පිටපතක් නොමැති බවට මූලස්ථාන ඉඩම් නිලධාරී පී.ඒ.ජී රත්නායක මහතා විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් ඇමතූ 2021 මාර්තු 09 දිනැති ලිපිය මගින් තහවුරු කර තිබුණි. නීත්‍යානුකූල නොමැති ලිපියක් නීතිමය ලියවිල්ලක් සේ සලකා කටයුතු කිරීම ගැටලු සහගත බවත් එම ලිපිය නීත්‍යානුකූල නොවන ලිපියක් බවට අගතියට පත් පාර්ශවය විසින් 2025 පෙබරවාරි 07 දින ඉදිරිපත් කළ ලිපියකින් දැනුම්දී තිබුණත් එයද තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.ඉහත 2025 ජනවාරි 09 දිනැති ලිපියේ 02 ඡේදය මගින් ඩබ්.ඒ ඇන්ටනී වීරසිංහ ඉඩම 2012 වර්ෂය දක්වා වගාකරන බවට සඳහන් කර තිබුණත් 2015 ජුනි 17 දින දෙබරවැව ඉඩම් කොමසාරිස් කාර්යාලයේ පැවති පරීක්ෂණයකදී ඩබ්.ඒ ඇන්ටනී වීරසිංහ විසින් ලබාදුන් දෙබරවැව ඉඩම් කොමසාරිස් ඇමතූ 2015 ජුනි 17 දිනැති ලිඛිත ප්‍රකාශයෙහි 2008 වර්ෂයේ සිට තම මල්ලි වන ඩබ්.ඒ.ප්‍රේමදාස වගාකරන බවත් පොහොර සහනාධාරයද ඔහු විසින්ම ලබාගත් බවට සඳහන් කර තිබුණි. එමෙන්ම 2016 අගෝස්තු 25 දිනැති දෙබරවැව ඉඩම් කොමසාරිස් කාර්යාලයේ මූලස්ථාන ඉඩම් නිලධාරීගේ ප්‍රකාශය තුලද මෙම ඉඩම 2008 වර්ෂයේ සිට ඩබ්.ඒ ප්‍රේමදාස වගාකරන බවත් එය ලිඛිත සාක්ෂි මගින් තහවුරු කර තිබූ බැවින් 2012 වර්ෂය දක්වා ඩබ්.ඒ ඇන්ටනී වීරසිංහ ඉඩම වගාකළ බවට දැක්වීම මතභේදාත්මක කරුණක් විය. එසේම ඩබ්.ඒ ඇන්ටනී නැමති අය සතුව 1992 වර්ෂයේ සිට නිරවුල්ව භුක්ති විඳින අක්කර 03 ක ප්‍රමාණයේ කුඹුරු ඉඩමක් තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් උනාව ප්‍රදේශයේ තිබියදී සහ 2023 සැප්තැම්බර් 05 දින ඔහු මියගොස් තිබියදී ඔහුගේ පුතා වෙත මෙම ඉඩම ලබාදීමට තීරණය කිරීම ගැටලු සහගත බවත් අනෙක් පාර්ශවය සතුව එවැනි දේපළක් නොතිබියදී ඔවුන්ට ද සහනයක් ලබානොදෙමින් මෙම තීරණය ගෙන තිබුණු බවට නිරීක්ෂණය විය. මෙම ගැටලුව සම්බන්ධයෙන් දීර්ඝ කාලයක සිට ලිපි හුවමාරු වී ඇති අතර කොමසාරිස් දෙපාර්තුමේන්තුවේ නිලධාරීන්ගේ රාජකාරී කටයුතුවල විනිවිදභාවයක් නොමැති තත්ත්වයක් හා දෙපාර්ශවය වෙත යොමු කර ඇති ලිපිවල පරස්පර තත්ත්වයක් තුළ ස්වාධීන පරීක්ෂණයක් මගින් මෙම ගැටලුව විසඳා ගැනීමට කටයුතු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) ලංවා සංස්ථා සිමෙන්ති කෝපරේෂන් පුද්ගලික සමාගමට ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 224 ජී.පනහඩුව ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පල්ලේබැද්ද ගමෙහි ඉඩමෙන් හෙක්ටයාර් 94.6174 ක් හෙවත් අක්කර 233 පර්චස් 58 ක ප්‍රමාණයක් වසර 50 ක කාලයක් සඳහා භූමියේ ඛණිජ ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා බදු දීමට තීරණය කර තිබුණි. ඒ අනුව 2022 සැප්තැම්බර් 05 දින රු.මිලියන 6.50 ක මුදලක් ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පළමු කුලී ගාස්තුව ලෙස ලබාගෙන තිබුණි.මෙම ඉඩම බදු දීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන 02 ක් විසින් පරිසරයට සිදුවන හානිය හා ගම්වාසීන්ගෙන් එල්ලවූ විරෝධතාවය නිසාත් මෙම ඉඩම බදු දීම සඳහා ගිවිසුම්ගත වීම තාවකාලිකව කල් දමා තිබුණි. ඉහත මුදල ලබාගෙන වසර 02 මාස 07 ක් ගතවී ඇතත් එම මුදල ආපසු ලබාදීමට මෙම වාර්තාවේ දින වනවිටත් කටයුතු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) 1996 ඔක්තෝබර් 31 දින අක්කර 182 ක ඉඩමක් කොරියානු සමාගමක් වෙත ගිවිසුම්ගතව ලංවා වානේ සංස්ථාව සියලුම වත්කම් හා වගකීම් ඇ.ඩො. මිලියන 15 කට පවරා තිබුණද එම විදේශීය සමාගම ගිවිසුම අනුව ක්‍රියාත්මක නොවීම මත මෙම ඉඩම Onyx Heavy Industries and Construction Company Limited වෙත නැවත පවරා 2010 වර්ෂයේදී සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් ආයතනය ලෙස නාමය වෙනස්කර තිබුණි. රජයේ ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තිය අනුව ඉඩමක් බාහිර පාර්ශ්වයක් වෙත නිදහස් කිරීමට අදාළව සිදුවිය යුතු ක්‍රියාදාමයක් අනුගමනය නොකර විදේශීය සමාගම වෙත ලබාදී තිබුණි. මෙම ඉඩම පැවරීම සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ උපදෙස් මත දීමනා පත්‍රය අවලංගු වන පරිදි කොන්දේසි ඇතුළත් නොකිරීම හා 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී නොදීමත්, නීතිපතිවරයා විසින් ලබා දුන් උපදෙස් පරිදි කොන්දේසි ඇතුලත් කරමින් කර්මාන්ත ශාලාව ක්‍රියාත්මක වන ඉඩම් ප්‍රමාණය පමණක් ලබාදීම වඩාත් ඵලදායී බවත් තවද කර්මාන්තශාලාව පවරා දෙන ලද අවස්ථාවට වඩා නවීන තාක්ෂණික උපකරණ භාවිතා කලද ආරම්භක ගිවිසුමෙහි සඳහන් පරිදි කර්මාන්ත ශාලාවෙහි කටයුතුවල ප්‍රගතියක් දක්නට නොලැබෙන අතර ආරම්භක ගිවිසුම අනුව ක්‍රියාත්මක නොවන තත්ත්වයක් තුල එවා යලි පවරා ගැනීමකට කටයුතු කර නොතිබුණි. එසේම දැනට භාවිතයට නොගත් අක්කර 160 ක ප්‍රමාණය පිළිබඳ තීරණයක්ද ගෙන නොතිබුණි.

(උ) 1982 ඉඩම් අත්පත් කර ගැනීමේ පනතෙහි 38(අ) වගන්තිය ප්‍රකාරව පවරා ගත් 492/D ග්‍රාම නිලධාරී වසමෙහි මු.පි. 9302 පිඹුරෙහි කැබලි අංක 02 දරන ඉඩම් කොටස නේවාසික කටයුත්තක් සඳහා දීර්ඝකාලීන බදුකරයක් මගින් පුද්ගලයෙකු වෙත ලබාදී තිබුණි. ඉඩම් කොමසාරිස් ජනරල්වරයාගේ අංක 4/10/35274 හා පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ අංක පළාත්/ඉ.කො/06/කො/571 දරන ලිපිය අනුව අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය

යටතේ කෙරෙන නිවේදනය අනුව 2012 අගෝස්තු 03 දිනැති ගැසට් පත්‍රය මගින් ගැසට් නිවේදනයක් නිකුත් කර මෙම ඉඩම අදාළ පුද්ගලයාට වසර තිහක කාලයක් සඳහා වාර්ෂිකව රු.800,000 ක මුදලකට බදු දී තිබුණි. 2025 පෙබරවාරි 20 දින වන විට අදාළ පුද්ගලයා මෙම ඉඩමෙහි නේවාසිකව පදිංචිව නොසිටි බව නිරීක්ෂණය විය. වාණිජ නගරයක් වන බත්තරමුල්ල ප්‍රදේශයේ පිහිටි මෙම ඉඩම නේවාසික පදනම් මත බදු දීම වැරදි ක්‍රියාවක් වන අතර මෙම කටයුත්ත සඳහා 2012 ජූලි 11 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ද ඉදිරිපත් කර තිබියදී එලෙස ගැසට් නිවේදන මගින් පැවරීම ගැටලු සහගත වන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඌ) උරුමය වැඩසටහන සඳහා 2024 වර්ෂයට අනුමත ප්‍රතිපාදනය රු.111,586,783 ක් වූ අතර 2024 දෙසැම්බර් 31 දින වන විට දැරූ සත්‍ය වියදම රු. 74,393,910 ක් විය. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ කොන්දේසි සහිතව නිකුත් කර ඇති අවසරපත්‍ර හා දීමනා පත්‍ර වෙනුවට මෙම වැඩසටහන යටතේ නිදහස් ප්‍රදාන පත්‍රයක් දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක E-slims පද්ධතිය හරහා මෙම කටයුතු සිදු කිරීමට කොමසාරිස් ජනරාල්ගේ 2023 දෙසැම්බර් 21 දිනැති 2023/01 වක්‍රලේඛයේ උපදෙස් නිකුත් කර තිබුණි. උරුමය වැඩසටහන යටතේ පරම අයිතිය සහිත ප්‍රදාන පත්‍ර 40,000 ක් ලබාදීමට 2024 ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම් කර තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විට පළමු අදියර යටතේ බෙදා හරින ලද ප්‍රදාන පත්‍ර 9,894 ක්ද, දෙවන අදියර යටතේ සම්පූර්ණ කරන ලද ප්‍රමාණය 12,468 ක් ලෙස එකතුව 22,362 ක් හෙවත් සියයට 55 ක් පමණක් ප්‍රදාන පත්‍ර පිළියෙළ කර තිබුණි. ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අනුමත කර E-slims පද්ධතියට ඇතුළත් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව 63,818 ක් වුවත් ඒ සඳහා "O" රේඛා චිත්‍ර 38,396 ක් ලබාදී තිබුණද දීමනා පත්‍ර සකස් කර අවසන් කර ඇත්තේ 12,468 ක් හෙවත් සියයට 19 ක ප්‍රමාණයක් විය. එමෙන්ම ජනාධිපතිවරයාගේ අනු අත්සන යොදන ලද ප්‍රදාන පත්‍රවලින් 12,468 න් 8,479 ක් පමණක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචියට යොමුකර තිබුණි.මෙම වැඩසටහන ක්‍රියාත්මක වීමේදී පහත දුර්වලතා නිරීක්ෂණය විය.

i. ජනතාව වෙත බෙදාහරින ලද ප්‍රදාන පත්‍රවල යාවත්කාලීන කරන ලද ලේඛනයේ පිටපත් කාර්තු අවසානයේ ලබා නොගැනීම නිසා මහජනතාවට බෙදා දුන් නිදහස් ප්‍රදාන පත්‍ර හා එහි ලියාපදිංචි විස්තර ආයතනය සතු නොවිය.

ii. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පරිගණක අවශ්‍යතාවයක් නොමැතිව හා අන්තර් පළාත් කාර්යාල සඳහා පරිගණක 16 ක අවශ්‍යතාවය පෙන්නුම් කර ප්‍රධාන කාර්යාලයේ අංශ අතර හා රත්මලාන පුහුණු අංශය සඳහා පරිගණක 71 ක් ද අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් ජනරාල් කාර්යාල 08 අතර පරිගණක 25 ක් ලෙස (බදු රහිත) රු.26,784,000 ක් වටිනා පරිගණක 96 ක් බෙදා දී තිබුණි.

iii. රාජකාරී අවශ්‍යතාවය සඳහා කාරයාලයෙන් බැහැර වීම සඳහා සංයුක්ත දීමනා ලබා දීම කළ යුතු අතර රජයේ වියදමින් ආහාරපාන ලබා නොදිය යුතු නමුත් දෙපාර්තමේන්තුවෙහි වියදමින් වැටුප්, අතිකාල, දෛනික නිවාඩු දින දීමනා, සංයුක්ත දීමනා ලබාගන්නා අතරතුර රු.7,262,303 ක වටිනාකමින් දිරිදීමනා ලබාගෙන තිබුණි.

iv. ජනාධිපති කාර්යාලයෙන් 001-02-06-021-2509 වැය ශීර්ෂය යටතේ රු.මිලියන 80 ක මුදලක් දෙපාර්මේන්තුව වෙත ලැබී එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 74.39 ක වියදමක් දරා තිබුණි.එම වැඩසටහන සඳහා 2023 ජූලි 16 දින සිට නැවත දැනුම් දෙන තුරු ඉඩම් කොමසාරිස් (පාලන),ඉඩම් කොමසාරිස් (බදු),ඉඩම් කොමසාරිස් (ප්‍රතිපත්ති හා විමර්ශන අංශවල) සේවය කරන අධීක්ෂණ නිලධාරීන් 07 දෙනෙකු සහ විෂය නිලධාරීන් 60 කට ආසන්න සංඛ්‍යාවක් දින රහිතව එම වැඩසටහනේ රාජකාරිය සඳහා නිදහස් කර තිබුණි. සකස් කරනු ලැබූ දීමනා පත්‍ර දිවයින පුරා බෙදාහැරීම ක්‍රියාත්මක කර ඒ සඳහා වාහන වෙනුවෙන් ඉන්ධන වියදම ලෙස දැරූ වියදම රු.12,098,938 ක් විය. එසේම රියදුරන් සහ නිලධාරීන් සඳහා අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීමට අමතරව සංග්‍රහ වියදම් ද දැරීමට සිදුවී තිබුණි. එසේම ජනාධිපතිවරයා පැමිණෙන උත්සව සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි කරවීමට ගාස්තු ගෙවමින් පෞද්ගලික බස් රථයක් ලබාගෙන 2024 පෙබරවාරි 12 දින වවුවර් අංක 51/02 මගින් රු.141,300 ක් මුදලක් ගෙවීම් කර තිබුණි.

v. 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනතේ නෛතික ප්‍රතිපාදන හා විධිවිධාන ප්‍රකාරව රජයේ ඉඩම් බැහැර කිරීමට ප්‍රදානය කර ඇති 19(2) අවසර පත්‍ර හා 19(4) ප්‍රදාන පත්‍රයන්හි පවතින I කොන්දේසි කාලීන, සමාජ, ආර්ථික තත්ත්වයන්ට ප්‍රමාණවත් නොවීම, වත්මන් සමාජයේ භූමිය ආශ්‍රිතව ගැටලුකාරී තත්ත්වයන් නිර්මාණය කර ඇති බැවින් භූමිය ආර්ථික සාධකයක් ලෙස සක්‍රීයව යොදා ගැනීම, පවතින නීති විධිවිධාන කාලානුරූපව සංශෝධනය කර ප්‍රදාන පත්‍රයන්හි කොන්දේසි ඉවත් කරමින් භූමියේ පරම අයිතිය ජනතාවට හිමිකර දීමට පූර්ණ කාලීනව මෙම වැඩසටහන සඳහා යොදා ගැනීම, ප්‍රාග්ධන භාණ්ඩ හා ලිපි ද්‍රව්‍ය අසීමිත ලෙස මිලදී ගැනීමට රු.36,583,430 ක් වටිනා භාණ්ඩ හදිසි මිලදී ගැනීම් මගින් මිලදී ගෙන තිබුණි.

vi. ඇනවුම් ලබා දුන් ආයතනය විසින් සැපයුම් කරන ලද A4 ජායාපිටපත් කඩදාසි පැකට් 300ක් නියමිත ප්‍රමිතියට නොතිබූ බැවින් ආපසු යවා දෙවනි මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතනයෙන් මිලදී ගෙන තිබුණි. එම නිසා රු.45200 ක පාඩුවක් සිදු සිදු විය. සාම්පල් පරීක්ෂාකර බලා මිලදී ගැනීම් සිදුවූයේ නම් මෙම පාඩුව සිදු නොවන බව නිරීක්ෂණය වේ.

vii. Quality First Stationaries ආයතනයෙන් අවස්ථා දෙකකදී ප්‍රදාන පත්‍ර මුද්‍රණයට Conquer Paper 40,000ක ප්‍රමාණයක් රු.3,520,000 වියදම් කර මිලදීගෙන තිබුණි. අවශ්‍ය ප්‍රමාණයට වඩා මිලදී ගත් මෙම කඩදාසි තොගයෙන් රු.1,056,000 ක් වටිනා පැකට් 24 ක් 2025 අප්‍රේල් 30 දින වන විට ස්ථාන දෙකක නිෂ්කාශීව පවතින බව නිරීක්ෂණය විය.

viii. සංවර්ධන අංශයට රු.32,649,500 ක් වටිනා පරිගණක 36 ක් ලැබී අතිරික්තයක් වූ බැවින් 2025 මාර්තු 14 දිනවන විට පරිගණක 12 ක් ආපසු ගබඩාවට භාරදී තිබුණි. එම අංශය සතුව තව දුරටත් භාවිතයට නොගත් පරිගණක 02 ක් තබා තිබුණි. එසේම රු.5,949,554 ක් වියදම් කර මිලදීගත් ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 15 ක් 2024 අප්‍රේල් 24 දින මෙම අංශය වෙත ලැබී ඒවා නැවත ගබඩාව වෙත භාරදී තිබුණි.මෙම අංශය වෙත ඡායා පිටපත් යන්ත්‍ර 03 ක් තිබියදී 2024 වර්ෂය තුළදී තවත් ඡායා පිටපත් යන්ත්‍ර 09 ක් මෙම අංශය වෙත ලබා දී තිබුණි. 2025 අප්‍රේල් 30 දින වන විට මෙම අංශය සතුව ඡායා පිටපත් යන්ත්‍ර 10 ක් පවතින අතර මෙම යන්ත්‍ර 2024 මැයි 16 දින රු. 4,131,180 ක් වියදම් කරමින් මිලදී ගෙන තිබුණි.

(එ) උරුමය වැඩසටහනට වෙනුවෙන් විශ්‍රාමික පරිපාලන සේවයේ නිලධාරීන් 08 දෙනෙකු 2024 මැයි මාසයේ සිට කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන රු.3,561,590 ක මුදලක් ගෙවීම් කර තිබුණි. භාණ්ඩාගාරය විසින් නිකුත් කළ ජාතික අයවැය වක්‍රලේඛ අංක 01/2024 ප්‍රකාරව කොන්ත්‍රාත් පදනමින් නිලධාරීන් බඳවාගත නොහැකි වුවත් මෙම නිලධාරීන් කඩිනමින් ඔප්පු සකස් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ කර ජංගම සේවා පැවැත්වීමට, රාජ්‍ය උත්සව ආකාරයට ඔප්පු ප්‍රදානය කිරීම ඒ සඳහා ජනාධිපතිවරයා ඇතුළු මැති ඇමතිවරු සහභාගී වීම කාර්යයන් සිදුකර තිබුණි. කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ලබාදීමේදී මෙම නිලධාරීන් විසින් ඉටු කළ යුතු කාර්යභාරය කුමක්ද යන්න පිළිබඳවත්, දෛනිකව සිදුකරනු ලැබූ කාර්යභාරය කුමක්ද යන්න පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහා කළ වැඩ වාර්තාවන් ගෙවීම් වවුචර් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. තවද මෙම පත්වීම් සම්බන්ධයෙන් ලිපිගොනුවලද එවැනි තොරතුරු නොවූ අතර දෛනිකව රාජකාරී ස්ථානයට පැමිණීම සහ පිටවීම සටහන් කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන ලේඛනය 2025 අප්‍රේල් 30 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් නොවීය. වියදම් අනුමත කිරීම, නිර්දේශ කිරීම, බලය දීම සහ ගෙවීම් සම්බන්ධ සම්බන්ධයෙන් වගකීමට යටත් වන බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ඒ) උරුමය වැඩසටහන කඩිනම් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයකින් තොරව තාවකාලික පදනම මත විශ්ව විද්‍යාල, කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල අධ්‍යාපනය හදාරණ සිසුන් 11 ක් බඳවාගෙන 2024 මැයි මස සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා එක් දිනයක් සේවය කිරීම වෙනුවෙන් රු.1,500 ක මුදලක් ගෙවීම් කර තිබුණි. ඒ අනුව එම සිසුන් සඳහා රු.1,618,500 ක් ගෙවීම් කර තිබුණි.

(ඔ) කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙහි ඉඩම් අංශයේ ඉඩම් I, ඉඩම් II හා ඉඩම් III ලෙස වෙන්කර රාජකාරී ඉටු කරමින් පවතින අතරතුර ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් 2023 අගෝස්තු 25 දිනැති ලිපිය සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කරමින් දෙපාර්තමේන්තුව විසින් මහජනයා වෙත සපයනු ලබන සේවය වඩාත් කඩිනමින් සහ කාර්යක්ෂම කිරීමේ අරමුණින් සහ දෙපාර්තමේන්තුවෙහි කාර්යසාධනය ඉහළ නැංවීමේ අරමුණින් මෙම දෙපාර්තමේන්තුවෙහි ඉඩම් අංශය ප්‍රතිව්‍යුහගත කරන බවට දක්වා තිබුණි. ඒ අනුව ඉඩම් බදු අංශය, පර්යේෂණ හා සංවර්ධන අංශය සහ ප්‍රතිපත්ති හා විමර්ශන අංශය ලෙස අංශයන් 03 කට වෙන්කර 2023 සැප්තැම්බර් මාසයේ සිට මෙම අංශය ක්‍රියාත්මක කර තිබුණි. එහෙත් 2024 වර්ෂයට අදාළව නිකුත් කරන ලද වාර්ෂික කාර්යසාධන වාර්තාවෙහි මෙම එක් එක් අංශයේ කාර්යභාරය පිළිබඳව වූ කාර්යසාධනය වෙන වෙනම ඉදිරිපත් කර නොතිබූ අතර සමස්තයක් ලෙස කාර්යසාධනය පිලිබඳ විස්තර ඉදිරිපත් කර තිබුණි.

(ඕ) 2024 වර්ෂයට අදාළව බිම්සවි වැඩසටහන් සඳහා අමාත්‍යාංශයෙන් රු.මිලියන 50 ක ප්‍රතිපාදනයක් වෙන්වී දෙපාර්තමේන්තුවෙහි වැය ලෙජරය අනුව එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 5 ක් ලබාගෙන තිබුණු අතර එමගින් වානේ කබඩ මිලදී ගැනීමට හා පුද්ගලයින් දෙදෙනෙකුට ගෙවීම සඳහා රු.917,602 ක් වියදම් කර රු.4,082,397 ක මුදලක් ඉතිරි වී තිබුණි. දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමේදී බිම්සවිය වැඩසටහනට අදාළව වාර්ෂික සැලසුම් සකස් කිරීම හා ප්‍රගති සමාලෝචනය කිරීම ප්‍රතිපත්තිය හා විමර්ශන අංශය භාරව කටයුතු කරනු ලබන ඉඩම් කොමසාරිස්වරිය වෙත පවරා තිබුණි. නමුත් මෙම නිලධාරිනිය යටතේ අධීක්ෂණය වන මෙම අංශයෙන් බිම්සවිය සම්බන්ධ කිසිදු කාර්යයක් සිදුවී නොමැති අතර අරමුණට පටහැනි ආකාරයටද වියදම් දරාතිබුණි.ඒ අනුව ප්‍රතිපාදන ඉතිරිවීම අරමුණට අනුව වියදම් නොකිරීම සම්බන්ධයෙන් නිලධාරීන් වගකිව යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

5. යහපාලනය

5.1 මහජනතාව වෙත සේවා ඉටු කිරීම

(අ) 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් නොමැති මහජනතාවට කෘෂිකාර්මික හා නේවාසික කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් ලබාදීම අවසර පත්‍ර හා දීමනාපත්‍ර ලබාදීම මගින් එම ලබාදුන් ඉඩම් එම ඉඩම් හිමියන් විසින් කිසිදු බාධාවකින් තොරව කෘෂිකාර්මික හා නේවාසික කටයුතු සඳහා භාවිතා කරමින් සිටින අතරතුර සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් 2023 දෙසැම්බර් 06 දින අංක5/6/1/1/CM/23/42 දරන සංදේශය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරමින් උරුමය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. එම සංදේශයෙ හි ඇමුණුම 02 හි සඳහන් වන

පරිදි,"ඉඩම් ආඥා පනතේ 19(4) යටතේ මහජනයා වෙත දීමනාපත්‍ර යටතේ ඉඩම් 1,191,223 ක්ද, ආඥා පනතේ 19(2) වගන්තිය යටතේ ලබා දුන් දීමනා පත්‍ර 80,000 ක් ලෙස සලකමින් පවුල් 2,000,000 කට පමණ ලබාදී තිබුණු ඉඩම් කැබලි සඳහා දැනට හිමිව තිබෙන අයිතිය තවදුරටත් තහවුරු කිරීම සඳහා ඉඩම් හා ගොවිබිම්වල පරම අයිතිය ලබාදීමට රජය විසින් උරුමය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට තීරණය කර එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2024 වර්ෂය සඳහා රු. මිලියන 111.58 ක් වෙන්කිරීම් කර එම ප්‍රතිපාදනයෙන් වර්ෂය අවසානය වන විට රු. මිලියන 70 ක් පමණ වියදම් කර පරම අයිතිය සහිත ප්‍රදාන පත්‍ර 22,362 ක් පමණක් ජනතාවට ලබා දී ඇත.මහජනතාවගේ ඉල්ලීමක් මෙන්ම ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සහ නිශ්චිත සැලැස්මකින් තොරව මෙම වැඩසටහන ආරම්භ කර ඇති අතර ජනතාවට මේ අයුරින් පරම අයිතිය ලබාදීමට ක්‍රියා කිරීමෙන් සිදුවන වාසි සහ අවාසි සහගත තත්ත්වයන් පිළිබඳවද කරුණු සොයා බැලීමත් කෘෂි කටයුත්තක් සඳහා ලබාදී ඇති මෙම ඉඩම් සඳහා පරම අයිතිය ලබා දුන්නහොත් භාහිර පාර්ශ්වයකට අයිතිය පවරා මුදල් ලබාගැනීම සිදුවිය හැකි බැවින් ඒ අනුව ඉඩම් පැවරීමේ රාජ්‍ය අරමුණද ඉටු නොවීමට ඉඩකඩ පවතින බව විගණනයේදී වැඩිදුරටත් නිරීක්ෂණය විය.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	කොන්ත්‍රාත් පදනම මත	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	95	36	-	59
තෘතීක	38	05	-	33
ද්විතීයික	710	458	09	252
ප්‍රාථමික	121	92	-	29
එකතුව	964	591	09	373

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ඉඩම් කළමනාකරණ කටයුතු කාර්යක්ෂම හා කාල ප්‍රමාදයකින් තොරව සිදුකර කාර්යාල කටයුතු විධිමත්ව පවත්වා ගැනීම දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් වුවත් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව සිදු කර ගැනීම සඳහා නිලධාරීන්ගේ අවශ්‍යතාව හා පුරප්පාඩු ගැන සැලකීමකින් තොරව ස්ථාන මාරුවීම් ලබා දී ඇති අවස්ථා පවතින බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

i. සහකාර ඉඩම් කොමසාරිස් / නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් යන තනතුරු සඳහා අනුමත තනතුරු සංඛ්‍යාව 26 ක් වුවත් 2023 හා 2024 වර්ෂයන් තුළදී නිලධාරීන් 05 දෙනෙකුට පමණ අනුප්‍රාප්තිකයකු රහිතව ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කිරීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 වන විට එම තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාව 13 ක් පමණ වී තිබුණි.

ii. දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරීන් හා කළමනාකරන සේවා නිලධාරීන්ගේ පුරප්පාඩු 2024 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් 33 ක් හා 74 ක් පමණ වූ නමුත් 2023 හා 2024 වර්ෂයන් වලදී එම තනතුරු පිළිවෙළින් 18 ක් හා 17 ක් සඳහා අනුප්‍රාප්තිකයකු රහිතව/ අනුප්‍රාප්තිකයකු පසුව ලබා දීමේ පදනම මත ස්ථාන මාරුවීම් ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය.

iii. භාෂා පරිවර්තක නිලධාරියකු, තොරතුරු සන්නිවේදන නිලධාරියකු හා තාක්ෂණ නිලධාරී හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරු 03 ක් සඳහා පුරප්පාඩු තනතුරු ඇතිවූ දා සිට පවතින බව විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව නිරීක්ෂණය විය.

පී.කේ.එම්.පී.නෝනිස්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට

පී.කේ.එම්.පී. නෝනිස්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන උපකාර්යාලය
නො: 07, කොටා ටෙරසය,
ආචාර්ය ඇන්.එම්. පෙරේරා මාවත
කොළඹ 08.